# කාර්යසාධන වාර්තාව - 2023



**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**(වැය ශීර්ෂ අංකය - 171)**

# පටුන


| අන්තර්ගතය | පිටු අංක |
|---|---|
| පරිච්ඡේදය 01 | |
| ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1 – 18 |
| පරිච්ඡේදය 02 | |
| ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 19 - 50 |
| පරිච්ඡේදය 03 | |
| වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 51 - 60 |
| ඇමුණුම I | |
| පරිච්ඡේදය 04 | |
| කාර්ය සාධන දර්ශක | 61 - 62 |
| පරිච්ඡේදය 05 | |
| තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 63 - 69 |
| පරිච්ඡේදය 06 | |
| මානව සම්පත් පැතිකඩ | 70 - 85 |
| පරිච්ඡේදය 07 | |
| අනුකූලතා වාර්තාව | 86 - 93 |

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 දැක්ම

සංවර්ධනයේ පූර්ණ ප්‍රතිලාභ සාධාරණව හා සමානව භුක්ති විඳින සමෘද්ධිමත් සමාජයක්

## 1.2 මෙහෙවර

ජාතික ප්‍රමුඛතා හා අවශ්‍යතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රමිතීන් ද සැලකිල්ලට ගනිමින් ආර්ථික සවිබලගැන්වීම, කාන්තාවන්, ළමුන්, අවදානමට ලක්විය හැකි හා වරප්‍රසාද නොලබන පුද්ගලයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා අවශ්‍ය නෛතික, ආයතනික හා මානව සම්පත් සේවා සැපයීම හා වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## 1.3 හැඳින්වීම, කාර්යයන් හා කර්තව්‍යයන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2289/43 හා 2022.07.22 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය මඟින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ස්ථාපිත විය. මෙම අමාත්‍යාංශය කාන්තා හා ළමා කටයුතු අංශය සහ සමාජ සවිබලගැන්වීම් අංශය යන අංශ දෙක යටතේ ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් විෂයන්ට සහ අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අමාත්‍යංශ විෂයය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය කටයුතුවලදී තීරණ ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ සහභාගීත්වය සහ නියෝජනය වැඩි කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගැටුම්වලින් හා දරිද්‍රතාවයෙන් විපතට පත් කාන්තාවන් සවිබලගැන්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සඳහා වන නීති හා ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත කාන්තාවන්ට වෙනස් කොට සැලකීම වළක්වාලීම සඳහා පවත්නා නීති සංශෝධනය කර නව නීති හා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම
- කාන්තා මූලික ගෘහ ඒකක සවිබලගැන්වීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.
- කාන්තා හා ළමා කටයුතුවලට අදාළ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීම.
- පෙර පාසැල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවන් ඇති කරලීමේ අභිප්‍රායෙන් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම.
- අනාරක්ෂිත තත්ත්වයේ සිටින දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සම්මතයන්ට ගැලපෙන සේ වැඩසටහන් හා ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ළමා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.
- ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම.
- සෙවන සරණ කැපකරු මව්පිය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
- සුවිශේෂී කුසලතා ඇති දරුවන්ගේ එම කුසලතා ඔප්නංවා ගැනීම සඳහා මුලාධාර සැපයීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගැනීම හා එම අවශ්‍යතා ඉටුකරදීම.
- මහජන ආධාර යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම, ප්‍රතිසංවිධානය හා උචිත නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

- ක්ෂය රෝගීන්ට, වකුගඩු රෝගීන්ට, ලාදුරු රෝගීන්ට, පිළිකා හා තැලසීමියා රෝගීන්ට සහ ඔවුන්ගෙන් යැපෙන්නන්ට ආධාර ලබාදීම.
- පවුල් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් අන්තර්ජාතික වශයෙන් පිළිගනු ලබන සම්මුතීන්වලට අදාළ කටයුතු.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පුහුණුව ලබාදීමට හා රැකියා අවස්ථා ඇති කරලීමට අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ජනප්‍රවාහනය හා එක්ව කටයුතු කිරීමට හැකි වනසේ අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කිරීම හා අවශ්‍ය පහසුකම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා සමාජ රක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- වයෝවෘද්ධ තැනැත්තන් රැකබලා ගැනීම, සමාජ සංවර්ධන කාර්යයන්හි වැඩිහිටියන්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීමට අවශ්‍ය පියවර ගැනීම.

ඉහත කාර්යය හා කර්තව්‍යයන් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ඉටුකරගැනීම සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු, ආයතන හා අංශ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

i. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ii. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD)
iii. සමාජ සේවා දෙපාර්තමේන්තුව (DSS)
iv. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
v. ජාතික කාන්තා කමිටුව
vi. ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSPD)
vii. වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලය (NSE)
viii. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)
ix. ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)
x. මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
xi. මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය
xii. ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
xiii. සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)
xiv. ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)
xv. උපදේශන අංශය

තවද ඉහත ආයතන සඳහා අවශ්‍ය පරිපාලන හා මෙහෙයුම් සහය ලබාදීමට ආයතන අංශය, ගිණුම් අංශය, සංවර්ධන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ සැලසුම් හා මෙහෙයුම් අංශය ක්‍රියාත්මක වේ.

ඒ අනුව, අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වැය ශීර්ෂ අංක 171 යටතේ ක්‍රියාත්මක වන අතර සමාජ සේවා දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ 216 යටතේද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේත්තුව වැය ශීර්ෂ 217 යටතේද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේත්තුව වැය ශීර්ෂ 331 යටතේද ක්‍රියාත්මක වේ. මෙම කාර්යසාධන වාර්තාව මඟින් වැය ශීර්ෂ අංක 171ට අදාළ ප්‍රගතිය දැක්වේ.

## 1.4 සංවිධාන සටහන



කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ගරු කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය
ගරු කාන්තා,ළමා කටයුතු රාජ්‍ය අමාත්‍ය
ගරු සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍ය
ලේකම්
කාන්තා හා ළමා කටයුතු අංශය
සමාජ සවිබලගැන්වීම් අංශය
කාන්තා හා ළමා කටයුතු අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා කටයුතු අංශය යටතේ පවතින ආයතන
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය
මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය
ජාතික කාන්තා කමිටුව
කාන්තා හා ළමා කටයුතු අංශය යටතේ පවතින අංශ
පාලන අංශය
ගිණුම් අංශය
සංවර්ධන අංශය
සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය
අභ්‍යන්තර විගණන අංශය
සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
සමාජ සේවා දෙපාර්තමේන්තුව
සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ පවතින ආයතන
සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය
ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය
වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය
ජාතික සමාජ සංවර්ධන ආයතනය
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
සමාජ සවිබල ගැන්වීම් අංශය යටතේ පවතින අංශ
උපදේශන අංශය
පාලන අංශය
ගිණුම් අංශය
සංවර්ධන අංශ
සැලසුම් හා මෙහෙයුම් අංශය
අභ්‍යන්තර විගණන අංශය

# 1.4.1 සංවිධාන සටහන (කාන්තා හා ළමා කටයුතු අංශය)



## 1.4.2 සංවිධාන සටහන (සමාජ සවිබලගැන්වීම අංශය




අධ්‍ය.ජ.(DSD)- අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අධ්‍ය.ජ.(NISD) - අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (Department of Samurdhi Development)
අති.අධ්‍ය.ජ. (DSD) - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (National Institute of Social Development)
ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ස.ලේ. - සහකාර ලේකම්
නි.අධ්‍ය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අධ්‍ය -සහකාර අධ්‍යක්ෂ
අධ්‍ය.(RDTRI) - අධ්‍යක්ෂ (Rural Development Training and Research Institute)
නි.සා. - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
සං.නි. - සංවර්ධන නිලධාරි

අධ්‍ය (සං) - අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍ය (සැල.) - අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍ය (SDB) - අධ්‍යක්ෂ - (Saubhagya Development Bureau)
ප්‍ර.ග. - ප්‍රධාන ගණකාධිකාරී
ප්‍ර.අ.වි. - ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍ය.(NSPD) -අධ්‍යක්ෂ (National Secretariat for Persons with Disabilities)
අධ්‍ය.(NSE) -අධ්‍යක්ෂ (National Secretariat for Elders)\
අධ්‍ය.(Coun) - අධ්‍යක්ෂ - (Counselling)
ස.සා. - සහකාර සාමාන්‍යාධිකාරී (Sri Lanka Social Security Board)
කල.සහ. - කලමනාකරණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

## 1.5 අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු/ආයතන හා අංශ

# කාන්තා හා ළමා කටයුතු අංශය

### පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

#### හැඳින්වීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් අනාථ, අත්හල, අසරණ හා ගැටුම්වලින් අවතැන් වූ යන සියලු කණ්ඩායම්වල ළමුන්ට සම අවස්ථාවන් ඇති කරලීම සඳහා ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නෛතික විධිවිධාන අනුව කටයුතු කරනු ලබන ජාතික මට්ටමේ ආයතනයයි.

#### ප්‍රධාන කාර්යභාරය

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටලුවලට යොමු වූ ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියලු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකරදීම යන මෙහෙවර යටතේ පරිවාස හා ළමාරක්ෂ සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

පරිවාස විෂයය යටතේ ප්‍රධාන වශයෙන් පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සඳහා සම්බන්ධීකරණය හා සහායවීම, පරිවාස විෂයය යටතේ ක්‍රියාත්මක වන විවිධ ආයතන සඳහා අවශ්‍ය අවස්ථාවලදී මඟපෙන්වීම, ජාතික ප්‍රතිපත්ති/ප්‍රමිතීන් සකස් කිරීම, විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, ළමුන්ට අදාළ නීති සංශෝධනය හා නව නීති සම්පාදන කටයුතු සඳහා සහාය වීම සිදු කරනු ලැබේ.

ළමාරක්ෂණ විෂයය යටතේ ළමා ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීම, ළමාරක්ෂණය සඳහා වන සමාජ ව්‍යූහයන් ස්ථාපිත කිරීම හා ශක්තිමත් කිරීම, ළමාරක්ෂණය සඳහා දිවයින පුරා ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ප්‍රවර්ධන සහකාර නිලධාරීන් හරහා සිදු කරනු ලැබේ.

### සංවර්ධන අංශය

#### හැඳින්වීම

2015 - 2030 තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ප්‍රමුඛ ඉලක්කයක් වන්නේ සෑම කාන්තාවකටම සහ දරුවෙකුටම ස්ත්‍රී පුරුෂ සමාජභාවිය වෙන්කිරීමකින් තොරව සමසාධාරණත්වයෙන් යුතුව ජීවත්වීම සඳහා සමාජයීය, ආර්ථික සහ නීතිමය වශයෙන් පවතින බාධාවන් ඉවත් කර ඔවුන් ඒ සඳහා සවිබලගැන්වීමය.

## ප්‍රධාන කාර්යභාරය

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම සඳහාත්, ඊට සහාය වනු පිණිස ශ්‍රී ලංකාව විසින් බැඳී සිටින විවිධ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතීන් හා ප්‍රඥප්තීන් ක්‍රියාත්මක කරන රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශවකරුවා වන කාන්තා හා ළමා කටයුතු විෂයය භාර අමාත්‍යාංශයෙහි, අනුබද්ධ ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන හා විදේශීය මෙන්ම දේශීය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම, පසුවිපරම මෙන්ම කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති අණපනත් හා ජාතික මට්ටමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම.

# සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

## හැඳින්වීම

කාන්තා හා ළමා ක්ෂේත්‍රය තුළ අමාත්‍යාංශ සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා සැලසුම්කරණය, මෙහෙයුම්කරණය, පසුවිපරම්කරණය සිදුකිරීම හා අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාවන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම, රාජ්‍ය ප්‍රතිපත්තිය හා ඊට අදාළ සියලුම තාක්ෂණික ප්‍රතිපත්තීන්ට අනුකූලව අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කටයුතු පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යභාරයන් වේ.

# මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

## හැඳින්වීම

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශය ඒකාබද්ධව මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා පසුවිපරම් කිරීම සිදුකරනු ලබන ජාතික යාන්ත්‍රණයයි.

## ප්‍රධාන කාර්යභාරය

- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය හා ජාලගත කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනයට අදාළ වන පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස්කිරීම සහ වැඩසටහන් සම්පාදනය කිරීම.
- මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අදාළ වන පුහුණු වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනයට අදාළ මානව සම්පත් සංවර්ධනය.

## මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

### හැඳින්වීම

මුල් ළමාවිය සංවර්ධන සේවාවන් සඳහා සාධාරණ ප්‍රවේශයන් ඉහළ නැංවීම හා ශ්‍රී ලංකාව තුළ එහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය 2016 දී ආරම්භ කරන ලද අතර 2023 වර්ෂයේ ජූනි මාසය දක්වා එම ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරකම් පවත්වාගෙන යන ලදී.

2023 වර්ෂයේ ව්‍යාපෘතියේ කටයුතු අවසන් වන අවස්ථාව වනවිට දිවයින පුරා පවතින 18,519ක් පමණ වන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි දරුවන් 657,526ක් පමණ ලියාපදිංචි කිරීම් කර ඇත. එම දරුවන්ගේ රැකවරණය හා සංවර්ධන සේවාවන් වෙනුවෙන් සාධාරණ ප්‍රවේශයක් හා ඒවායේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියේ උපාය මාර්ගික ක්ෂේත්‍ර 05හි දක්වා ඇති ප්‍රධාන මැදිහත්වීම් කිහිපයකට සහාය දැක්වීමක් සිදුකරන ලද අතර ,

1. මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධන සේවාවන් ලබාදීම ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම
2. ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය හා ඇගයීම

යන ප්‍රධාන සංරචක දෙක වටා ව්‍යුහගත කරමින් ක්‍රියාත්මක කරන ලදී.

මුල් ළමාවිය ගුරුවරුන් හට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම මෙන්ම අඩු හා දුර්වල පහසුකම් සහිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයන්හි සේවාවන් සම්බන්ධයෙන් ඒවායෙහි ගුණාත්මකභාවය පිළිගත් ප්‍රමිතීන්වලට අනුකූලව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය සහාය විය.

### ප්‍රධාන කාර්යභාරය

- අඩු ප්‍රතිලාභ සහිත/ප්‍රතිලාභ නොලද ප්‍රදේශවල නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම හා පෙර පාසල් නවීකරණය කිරීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ කට්ටල ලබාදීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා කියවීමේ ද්‍රව්‍ය කට්ටල ලබාදීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වෙත ජල පෙරණ උපකරණ (Water Filters), ක්‍රීඩා උපකරණ, ලී බඩු උපකරණ ලබාදීම.
- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
- පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජනමාධ්‍ය හරහා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරවේල ලබාදීම (2023 ජනවාරි සිට ජූනි දක්වා)

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

### හැඳින්වීම

1998 අංක 50 දරණ පනත මඟින් පිහිටවනු ලැබූ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සියලු ආකාරයේ ළමා හිංසන හා අපයෝජනය වැළැක්වීම සඳහාත් ළමුන් ආරක්ෂාව හා රැකවරණය සඳහාත් ජාතික මට්ටමින් ක්‍රියාත්මක ආයතනය වන අතර රජයට ළමා ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති හා නීති සම්පාදනය වෙනුවෙන් උපදෙස් ලබාදීමද සිදු කරයි.

### ප්‍රධාන කාර්යභාරය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තිය ප්‍රකාරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික, පරිපාලන හෝ වෙනත් ප්‍රතිසංස්කරණ සංවර්ධනය කිරීම, ළමුන්ට එරෙහි සාහසිකත්වය පිළිබඳ ජාතික දත්ත පදනම සංවර්ධනය සහ පවත්වාගෙන යාම, මහජනතාවගෙන් ළමා අපයෝජන සම්බන්ධ පැමිණිලි ලබා ගැනීම හා නිසි බලධාරීන් වෙත යොමු කිරීම, ළමා අපයෝජන නඩු ක්‍රියාවලිය අධීක්ෂණය හා නීතිය සමඟ ගැටෙන හා සම්බන්ධ වන ළමයින් සඳහා ආධාර, අධීක්ෂණය සහ පසු විපරම් සිදු කිරීම, ළමා ආරක්ෂක සේවා සහ පහසුකම් සැපයීම සඳහා අවම ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ. එමෙන්ම ළමයාගේ උපරිම යහපත සඳහා ළමා අපයෝජන වැළැක්වීම හා අපයෝජනයට ගොදුරු වූ ළමයාට ප්‍රතිචාර දැක්වීමේ අරමුණු ඇතිව ජාතික වැඩසටහන් සංවර්ධනය සහ පැවැත්වීම. සියලු ආකාරයේ අපයෝජනවලින් ළමයාගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රමවේදයන් හා ළමා ආරක්ෂණ දැනුම ප්‍රචලිත කිරීම සඳහා ළමුන්, යෞවනයන්, වෘත්තිකයන් සහ මහජනතාව දැනුවත් කිරීම, තොරතුරු සහ අධ්‍යාපනය ලබාදීම හා ළමා ආරක්ෂණය හා ළමා සංවර්ධනය පිළිබඳ පාර්ශවකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු, සාකච්ඡා, සහ සංසද ආදිය පැවැත්වීමද ප්‍රධාන කාර්යයන් අතර වේ.

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### හැඳින්වීම

කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නංවන ජාතික යාන්ත්‍රණයයි. ශක්තිමත් සංවිධාන ජාලයක් ඇති කරමින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සාමූහික ක්‍රියාවලියක් හරහා ඉටු කිරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය කටයුතු කරනු ලබයි.

### ප්‍රධාන කාර්යභාරය

ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම මෙන්ම සියලුම වයස් පරාසවල කාන්තාවන්ගේ සුවිශේෂතා හඳුනාගෙන ඔවුන් උචිත පරිදි රටේ සමස්ත සංවර්ධනයේ කොටස්කරුවන් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන කාර්යභාරයන් අතර වේ.

කාන්තාවන් වීම නිසාම ඔවුන් මුහුණදෙන සමාජයීය දුෂ්කරතා මග හැරවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සමාජයේ විශේෂ හේතූන් නිසා විවිධ පීඩාවන්ට මුහුණදෙන කාන්තාවන් අරභයා විශේෂ වැඩසටහන් මෙන්ම සමස්ත කාන්තා පරපුරේ දැනුම, කුසලතා සහ ආකල්ප ඉහළ තලයකට නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද සිදුකරනු ලබයි. තවද කාන්තාවන්ට එකම සංවිධානයක්

තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජා මූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීමද ප්‍රධාන කාර්යයන්ය.

## ජාතික කාන්තා කමිටුව

### හැඳින්වීම

1993 මාර්තු 08 දින පිහිටවනු ලැබූ ජාතික කාන්තා කමිටුව මඟින් කාන්තා ප්‍රඥප්තියේ නිර්දේශ ක්‍රියාවට නංවනු ලබයි. කාන්තාවන්ගේ සුබසිද්ධිය, ආරක්ෂාව, රැකවරණය වෙනුවෙන් ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරනු ලබන ජාතික ආයතනයයි.

### ප්‍රධාන කාර්යභාරය

සමානාත්මතාවය තහවුරු වූ, හිංසනයෙන් තොර, කාන්තාවන්ට හිතකර ශ්‍රී ලාංකික සමාජයක් බිහි කිරීමේ අරමුණින් පිහිටුවන ලද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ප්‍රවර්ධනය කිරීම, සමානාත්මතාවය තහවුරු කිරීම හා පූර්ණ සංවර්ධනයට ඉවහල් වන ප්‍රතිපත්ති හා නීති පද්ධතීන් සකස් කිරීම වේ. මේ සඳහා ජාතික කාන්තා කමිටුව මඟින් නිර්දේශ හා සහාය ලබාදීම හා අධීක්ෂණය කර ඇගයීම සිදු කරනු ලබයි. ඒ අනුව ජාතික කාන්තා කමිටුව තුළ පැමිණිලි මධ්‍යස්ථානයක් සහ පැය 24 පුරාම අවශ්‍ය සේවා සපයන ගාස්තු රහිත 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව ක්‍රියාත්මක වේ. එම සේවාවන් මඟින් නීති උපදෙස් ලබාදීම, උපදේශනය ලබාදීම හා අදාළ ආයතන වෙත පැමිණිලිකරුවන් යොමු කිරීම හා වාර්තා කැඳවීම සිදු කරනු ලබයි. එමෙන්ම ලැබෙන පැමිණිලි සම්බන්ධව කාලීන පසුවිපරම් කිරීමද ජාතික කාන්තා කමිටුවේ ප්‍රධාන කාර්යභාරයකි.

## පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛවලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරීම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වාගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ. අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරික්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් ආයතනයේ අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

# සමාජ සවිබලගැන්වීම් අංශය

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය සහතික කිරීම අරමුණු කොටගෙන, ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා සෑම දිළිඳු පුද්ගලයෙකු තුළම පවතින සැඟවුණු විභවතාවන් යටපත් කරගෙන ඇති බාධක දුරලමින්, එම පවුල් සවිබලගැන්වීම, සමාජ ආරක්ෂණය සහ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධිත) පනතින් සංශෝධිත හා 2013 අංක 1 දරන දිවිනැගුම පනත මඟින් ස්ථාපිත කර ඇත.

### ප්‍රධාන කාර්යභාරය

- පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධන, ජීවනෝපාය සංවර්ධන ,ව්‍යවසාය සංවර්ධන හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- "අස්වැසුම" සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ හඳුනාගෙන ඇති පවුල් ආර්ථික, සාමාජීය හා මානසික වශයෙන් සවිබලගැන්වීමට කටයුතු කිරීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග හා ජීවනෝපාය මාර්ග නගාසිටුවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම හා එම පවුල්වල සමාජ ආරක්ෂණය සැලසීම.

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස් මහතාගේ මූලිකත්වයෙන් 1944 වර්ෂයේ පත්කරන ලද කොමිෂන් සභාවේ නිර්දේශ මත 1948 පෙබරවාරි 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලද අතර ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් රටේ ජන කොටස්වලට වඩාත් යහපත් වටපිටාවක් ගොඩනැගීමේ අරමුණින් යුතුව මෙම දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

### ප්‍රධාන කාර්යභාරය

- ආබාධ සහිත ප්‍රජාව පුනරුත්ථාපනය, පූර්ණ කාලීන නේවාසික රැකවරණය ලබාදීම හා සවිබලගැන්වීම
- මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මැදිහත්වීම
- දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ කටයුතු සිදු කිරීම
- වත්මන් සමාජ ගැටළු සම්බන්ධයෙන් පර්යේෂණ/සමීක්ෂණ පැවැත්වීම, මැදිහත්වීම සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

## ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

### හැඳින්වීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති අතර, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් උදාකරදීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අභිප්‍රායෙන් **ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව** මඟින් ගන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් සිදුකරයි.

### ප්‍රධාන කාර්යභාරය

- ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සපයා ඔවුන් රැකබලා ගැනීමේ පහසුකම් සැලසීම සහ පුද්ගලයින් සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු මෙහෙයවීම, උපදෙස් දීම සහ ආධාර දීම
- භෞතික පරිසරය යෝග්‍ය පරිදි සැකසීම සඳහා වැඩසටහන් සහ ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශ ලබාදීම.
- ආබාධ ඇතිවීමේ ප්‍රධාන හේතු වැළැක්වීම සහ පාලනය කිරීම, පුනරුත්ථාපනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම හා ප්‍රවර්ධනය.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

### හැඳින්වීම

ශ්‍රී ලාංකික වැඩිහිටි ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ හා සංවර්ධනය කිරීමේ සුවිශේෂී අවස්ථාවක් ලෙස 2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය පිහිටුවීම සිදුකර ඇත.

### ප්‍රධාන කාර්යභාරය

- වැඩිහිටියන්ට රැකවරණය, ආරක්ෂාව හා සුභසාධනය ලබාදීම පවුල තුළින්ම ඉටුකළ යුතු කාර්යභාරයක් බවට සමාජය දැනුවත් කිරීම.
- වැඩිහිටියන් රැක බලා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කිරීම.
- වැඩිහිටියන්ගේ හැකියාවන්, කුසලතා සංවර්ධනය මඟින් ආදායම් උත්පාදන මාර්ගයන්ට යොමු කරවීම.
- දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් විශ්‍රාම දිවිය තුළ මුහුණ දෙන ගැටළු මඟහැරවීමට සූදානම් කිරීම.
- පිහිටක් අවැසි වැඩිහිටියන් සඳහා රැකවරණය සැලසීම.

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

### හැඳින්වීම

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත මඟින් හා 1999 අංක 33 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිතව ක්‍රියාත්මක වන ආයතනයකි. රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති ස්වයං රැකියා නියුක්තිකයින් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

### ප්‍රධාන කාර්යභාරය

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකට පත් වූ විට එම කාලයේ දී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් මියගියවිට, ඔවුන්ගේ යැපෙන්නන්ට සහන සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයින් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම

## ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

### හැඳින්වීම

1992 අංක 41 දරන පාර්ලිමේන්තු පනත මඟින් ජාතික සමාජ සංවර්ධන ආයතනය නමින් උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත වූ මෙම ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25 ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස 2005 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර ඇති අතර සමාජ වැඩ (Social Work) පිළිබඳව අධ්‍යාපනය ලබාදෙන ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය ආයතනය වේ.

ආයතනයේ කේන්ද්‍රීය අංශය වන පාලක සභාව (Governing Council) මඟින් ආයතනයේ පරිපාලනය, කළමනාකරණය හා මූල්‍යමය කටයුතු සම්බන්ධව ක්‍රියාකරනු ලබයි. පාලක සභාව යටතේ ක්‍රියාත්මක අධ්‍යයන කටයුතු මණ්ඩලය (Academic Affairs Board) ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා වන උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදීම සිදු කරයි.

ආයතනයේ ක්‍රියාකාරී කටයුතු එකිනෙකට බද්ධ වූ අංශ 4 කින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවානම්,

1. සමාජ සේවා විද්‍යාලය
2. පුහුණු අංශය
3. සමාජ සංවර්ධන, ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය
4. පරිපාලන හා මුදල් අංශය

## ප්‍රධාන කාර්යභාරය

- සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම
- සමාජ වැඩ සහ සමාජ සංවර්ධනය පිළිබඳ උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම.
- සමාජ සුභසාධන ක්‍රම සහ සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳව අධ්‍යයන කටයුතු පැවැත්වීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.
- සමාජ වැඩවලදී තාක්‍ෂණය උපයෝගී කර ගැනීම ඇතුළුව සමාජ වැඩ සහ සමාජ සංවර්ධන අධ්‍යාපන ක්‍රමයෙහි නිර්මාණාත්මක පරිවයක් ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

# සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

## හැඳින්වීම

ගෘහ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කර ග්‍රාමීය ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නංවමින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමත්, ජාතික නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් ලබාදීමත්, අරමුණු කර ගනිමින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන මෙම කාර්යාංශය මඟින් රට පුරා ක්‍රියාවට නංවනු ලබයි.

මීට අමතරව, ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණ පෙරදැරි කරගෙන ක්‍රියාත්මක කරන ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ පිහිටුවා ඇති ග්‍රාම ශක්ති සමිති ශක්තිමත් කර ඉදිරියට පවත්වාගෙන යාමටද මෙම කාර්යාංශය දායකත්වය දක්වනු ලබයි.

## ප්‍රධාන කාර්යභාරය

කිසියම් ප්‍රදේශයක පවතින නිෂ්පාදන විභවතාව, සම්පත් සුලභතාව, වෙළඳපොල යනාදී කරුණු පදනම් කරගෙන, අදාළ ක්ෂේත්‍රයන් කෙරෙහි වූ විභවතාවයක් සහිත පිරිස් ද සම්බන්ධ කර ගනිමින්, අඩු ආදායම්ලාභී පවුල් සෘජුවම නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගනිමින්, ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහල නැංවීමට අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, තාක්ෂණික සහය, පුහුණු වැඩසටහන් ලබාදීම හා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබාදීමට සහය වීම.

# ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

## හැඳින්වීම

1974 වර්ෂයේ දී ආරම්භ වූ මෙම ආයතනය, 1978 වර්ෂයේ සිට ග්‍රාම සංවර්ධනය හා දිළිඳුකම පිටුදැකීමේ ක්‍රමෝපායක් ලෙස, සංවර්ධන ප්‍රවාහයෙන් ආන්තිකකරණයට ලක් වූ දිළිඳු ප්‍රජාවගේ විභව ශක්තීන් මතු කරමින් ඔවුන්ගේ ස්වශක්තිය හා සාමූහිකත්වය වර්ධනය කිරීම සඳහා සහභාගිත්ව සංවර්ධන සංකල්පය මත පදනම් වූ විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන තුළින් නව සංවර්ධන ක්‍රමවේදයක් හඳුන්වාදුන් ජාතික ආයතනයකි. දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණපාන අවාසිදායක තත්ත්වය, වඩා වාසිදායක තත්ත්වයක් බවට පරිවර්තනය කර ගැනීමට අවශ්‍ය බලගැන්වීමේ උත්ප්‍රේරණ ක්‍රියාවලිය මෙම ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරයකි.

## ප්‍රධාන කාර්යභාරය

- ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම කළමනාකරණය
- ප්‍රජා සංවර්ධන වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළනැංවීම
- නවෝත්පාදන සංවර්ධන ප්‍රවේශයන් හඳුන්වාදීම

# උපදේශන අංශය

## හැඳින්වීම

ප්‍රජාව මුහුණපාන මානසික ගැටළුකාරී තත්ත්වයන්, මානසික අසමතුලිතතා හා විවිධාකාර මනෝසමාජීය ගැටලු සඳහා, මනෝවිද්‍යාත්මක උපදේශන හා ප්‍රතිකාරාත්මක ක්‍රමවේද භාවිතා කරමින් මානසික යහපැවැත්ම ගොඩනැගීම මෙම අංශය මඟින් සිදු කරයි.

## ප්‍රධානකාර්යභාරය

- පුද්ගලයින් මුහුණපාන මානසික ගැටළුකාරී තත්ත්වයන්, මානසික ආබාධ, මානසික ලෙඩ රෝග හා විවිධාකාර මනෝසමාජයීය ගැටළු හඳුනාගෙන එම තත්ත්වයන් අවම කිරීමට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් සිදු කිරීම.
- ප්‍රජාව මානසිකව සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන මැදිහත්කරණය යොදාගනිමින් දැනුවත් කිරීමේ කණ්ඩායම් උපදේශන වැඩසටහන් පැවැත්වීම.
- මානසික ආබාධ හා මානසික ගැටළු සහිතව පැමිණෙන සේවාලාභීන් සඳහා ගුණාත්මක උපදේශන සේවා සපයමින් මානසික යහපැවැත්ම ගොඩනැංවීම.
- ජංගම දුරකථන උපදේශන සේවාව හරහා තනි පුද්ගල උපදේශන සේවා සැපයීම.
- සමාජ සංවේදීතාවය වඩාත් අවශ්‍යවන ප්‍රජා කණ්ඩායම් හඳුනාගෙන ඔවුන්ගේ මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ උපදේශන වැඩසටහන් සිදු කිරීම.

# පාලන අංශය

අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතනවල මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය සඳහා ආයතන රෙගුලාසි, චක්‍රලේඛවලට අනුකූලව හා අවස්ථානුකූලව කටයුතු කිරිම සඳහා පාලන අංශය ක්‍රියාත්මක වේ. පාලන අංශය මඟින් පහත සඳහන් කාර්යයන් සිදුකරමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන හා අංශවලට කාර්යක්ෂම සේවාවක් ලබාදෙයි.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් සියළුම ආයතනවල කාර්ය මණ්ඩලයට අදාළ ආයතනික හා පරිපාලන කටයුතු  මෙහෙයවීම.
- දේශීය හා විදේශීය පුහුණුවීම් ලබාදීම තුළින් මානව සම්පත් හැකියා සංවර්ධනය කිරීම.
- අමාත්‍යාංශ විෂය පථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ, පනත්, කෙටුම්පත් ආදිය නිසි පරිදි ඉදිරිපත් කිරිම මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක වීම.
- අවශ්‍ය මානව සම්පත් හා යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු ආයතන හා අංශයන්හි අරමුණු ළඟාකර ගැනීම සඳහා උපදෙස් ලබාදීම, මඟ පෙන්වීම හා මෙහෙයවීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද පහත සඳහන් විශේෂිත සංවර්ධන වැඩසටහන්හි අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් ඉටු කර ඇත.

- 2022/2023 වර්ෂයේ මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ සමෘද්ධි, ආබාධිත, වැඩිහිටි හා වකුගඩු දීමනා ලාභීන් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සඳහා මාර්තු සහ අප්‍රේල් මාසයන්හිදී, එක් පවුලකට සහල් කිලෝ 10 බැගින් ලබාදීමේ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්වේච්ඡා කටයුතු පිළිබඳ ලේකම් කාර්යාලය අමාත්‍යාංශය තුළ පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත.

## ගිණුම් අංශය

මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගැනීම, කළමනාකරණය කිරීම හා ගෙවීම් සිදුකිරීම සමඟම, රාජ්‍ය ගිණුම් පවත්වා ගනිමින් විනිවිදභාවයකින් යුතුව, මුදල් රෙගුලාසි මඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත පැවරී ඇති බලතල, මූල්‍ය විනයකින් යුතුව පවත්වාගෙන යාම පැවරී ඇති අංශය ගිණුම් අංශය වේ.
අමාත්‍යාංශයට අදාළ ගිණුම් කටයුතු සහ සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට අමතරව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා මණ්ඩලවල ගිණුම් සුපරීක්ෂණය සිදුකරනු ලැබේ.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශ ලේකම් වෙත සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වන අතර අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන සේවාවන් හා වැඩසටහන් ගුණාත්මකව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කළමනාකරණ විගණනය, පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවදානම් සහිත ක්ෂේත්‍ර පාදක කරගත් විගණනය සිදු කිරීම තුළින් අපේක්ෂිත සංවර්ධන ඉලක්ක ළඟාකරගැනීමට මඟපෙන්වීම් සිදු කිරීම කරනු ලබයි.

## සැලසුම් හා මෙහෙයුම් අංශය

සමාජ සවිබලගැන්වීම් අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, ක්‍රියාත්මක වැඩසටහන් මෙහෙයවීම සහ ප්‍රගති පාලනය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධීකරණ කිරීම සැලසුම් හා මෙහෙයුම් අංශය යටතේ සිදුවේ. තවද විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි සම්බන්ධිකරණ හා අධීක්ෂණ කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරයි.

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ මුල්‍ය ඇස්තමේන්තුව (රු.මිලියන) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව | 695.394 | 2022 සැප්තැම්බර් සිට 2024 අගෝස්තු දක්වා |
| 2 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම හා කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම පිළිබඳ ව්‍යාපෘතිය | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | 7.297 | 2023 වර්ෂය ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා |
| 3 | තිරසර ප්‍රජා පදනම් වූ පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන | සෙමාවුල් ගෝලීය පදනම | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023-2027 |
| 4 | සමාජ ආර්ථික අර්බුදයෙන් වැඩිම පීඩාවට පත් වූ කාන්තාවන් සඳහා හදිසි සහන සැලසීමේ ව්‍යාපෘතිය. | එක්සත් ජාතීන්ගේ කාන්තා ඒකකය (UN WOMEN) | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023 අගෝස්තු සිට 2024 පෙබරවාරි දක්වා |
| 5 | කාන්තාවන් ව්‍යවසායකත්වය, නායකත්වය හා ජාලකරණය හරහා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය | JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය) | අදාළ ප්‍රධායක ආයතනය සෘජුව වියදම දරමින් ක්‍රියාත්මක කරනු ලබයි. | 2023-2025 |

# පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 නෛතික විධිවිධාන ශක්තිමත් කිරීම

### කාන්තා හා ළමා කටයුතු අංශය

**ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමානාත්මතා පනත හඳුන්වා දීමට කටයුතු කිරීම.**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදුව අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගරු නීතිපතිතුමාගේ නිරීක්ෂණයන් ද ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු කරමින් පවතී.

**කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හඳුන්වා දීම.**

කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මඟින් කෙටුම්පත් කළ අතර, ඒවා ගරු නීතිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලදුව නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
ජාතික කාන්තා කොමිසම පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත ඒකාබද්ධ කිරීම සුදුසු බවට ගරු නීතිපතිතුමා විසින් ලබාදුන් නිරීක්ෂණ අවධානයට ගෙන ජාතික කාන්තා කොමිසම පිහිටුවීමේ පනත් කෙටුම්පත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත් කෙටුම්පත ඒකාබද්ධ කර එක් පනත් කෙටුම්පතක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් ඉහත පනත් දෙක ඒකාබද්ධ කර එක් පනත් කෙටුම්පතක් ලෙස සකස් කරමින් පවතී.

**ළමා අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත**

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ළමා අයිතිවාසිකම් සුරැකීමට අදාළ සියලු නීති රීති හා අණපනත් අධ්‍යයනය කර වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි එක් පනතක් වශයෙන් ළමා අයිතිවාසිකම් නීතිගත කිරීම මෙහි අරමුණයි. මේ වන විට ඒ පිළිබඳ අධ්‍යයනය කර සංකල්ප පත්‍රිකාව සකස් කර ඇත.

### සමාජ සවිබලගැන්වීම් අංශය

**ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වෙනුවට නව පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා 2023.03.13 දින කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී. එම අනුමැතියට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කෙටුම්පත අධිකරණ අමාත්‍යාංශය හරහා මෙම අමාත්‍යාංශය වෙත එවන ලද අතර ඒ සඳහා වන නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත යවා ඇත.

**සංඥා භාෂා පනත් කෙටුම්පත**

සංඥා භාෂා පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කර එවා ඇති අතර ඒ සඳහා වන එකඟතාවය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

### ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය 2006 අංක 1 දරන ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරණ අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතීන් හා පිරිවිතරයන් සැලකිල්ලට ගෙන ප්‍රවේශ නියෝග කෙටුම්පත් කර ඇති අතර අදාළ පාර්ශවයන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීමට නියමිතය.

## 2.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### කාන්තා හා ළමා කටයුතු අංශය

### සංවර්ධන අංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. කාන්තාවන් හා ළමුන්ට අදාළ ප්‍රතිපත්ති අණ පනත් හා ක්‍රියාකාරී සැලැසුම් සකස් කිරීම**

- **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය**
  2023 මාර්තු 8 දින ජාත්‍යන්තර කාන්තා දිනයේදී භාෂාත්‍රයෙන් එළිදක්වන ලදී. ප්‍රතිපත්තිය මත පදනම්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් කෙටුම්පත් කිරීම සිදුකරමින් පවතී. ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවෙතින් තොරතුරු කැඳවා පරතර විශ්ලේෂණයක් සිදුකිරීම.

- **එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනාව - 1325 ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තාව, සාමය සහ ආරක්ෂාව පදනම්කරගත් පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2023-2027)**
  2023 මාර්තු මස 8 වැනි දිනට යෙදුණු ජාත්‍යන්තර කාන්තා දිනයේදී භාෂාත්‍රයෙන් එළිදක්වන ලදී. මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුව ස්ථාපිත කර ඇති අතර ක්‍රියාකාරකම් හා සම්බන්ධිත අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන දැනුවත් කර කේන්ද්‍රීය නිලධාරීන් පත්කරගෙන ඇත. ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අයවැය සම්පාදනය කරගැනීමට ප්‍රධායක ආයතන රැස්වීමක් පැවැත්වීමට නියමිතය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා පනත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හඳුන්වා දීම සඳහා කටයුතු කිරීම. මෙම පනත් කෙටුම්පත් දෙකෙහි අවසන් පනත් කෙටුම්පත් සකස්කර නීතිපති නිෂ්කාශනය ලබාගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

- “ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා එක් නීතියක් සකස් කිරීම” පනත හඳුන්වා දීම සඳහා කටයුතු කිරීම. මීට අදාළව පරතර විශ්ලේෂණය හා සංකල්ප පත්‍රිකාව කෙටුම්පත් කර ඇත. මෙම පනත සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හා ලිංගිකත්වය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි (2024-2028) ආංශික සැලසුම් සියල්ල සම්පාදනය කර භාෂා පරිවර්තනය සඳහා යොමුකර ඇත.

- තාවකාලික කාන්තා රැකවරණ නිවාස පවත්වාගෙනයාම පිළිබඳ මාර්ගෝපදේශ කෙටුම්පත සකස්කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.
- මිනිස් ජාවාරම පිටුදැකීම හා මෙහෙයවීම පිළිබඳ ජාතික උපායමාර්ගික සැලැස්මේ අප අමාත්‍යාංශයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 2. තොරතුරු, වාර්තා/ප්‍රගති වාර්තා ලබාදීම හා සම්බන්ධීකරණ කටයුතු

- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යන ආයතන සම්බන්ධීකරණය කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, ජාතික කාන්තා කමිටුව යන අංශයන් අධීක්ෂණය, සම්බන්ධීකරණය හා පසුවිපරම් කටයුතු කිරීම.
- ළමුන්, කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, ළමුන් සඳහා වන පාර්ලිමෙන්තු සංසදය හා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ කාන්තා සංසදය සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුලු රාජ්‍ය නොවන සංවිධාන හා අන්තර්ජාතික සංවිධාන සම්බන්ධීකරණය කිරීම.
- කාන්තා හා ළමා විෂයට අදාළව විදේශ කටයුතු අමාත්‍යාංශයට වාර්තා යොමු කිරීම.
    - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්වකාලාන්තර සමාලෝචන (UPR) සැසියට ශ්‍රී ලංකාව ලබාදුන් ජාතික වාර්තාව සමාලෝචනයේදී යෝජිත නිර්දේශ ලැයිස්තුව සඳහා අප අමාත්‍යාංශයට අයත් විෂයය පථයට අයත් යෝජිත නිර්දේශ සඳහා අමාත්‍යාංශයේ එකඟතාවයන් ලබාදීම.
    - කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට (CEDAW) අදාළව ශ්‍රී ලංකාවේ 9වැනි කාලාන්තර වාර්තාව (2022) සඳහා ඉදිරිපත් කරන ලද ගැටළු 21ට අදාළව පිළිතුරු සකස් කර විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ජාත්‍යන්තර CEDAW කමිටුව වෙත 2023 වර්ෂයේදී යැවීමට කටයුතු කර ඇත.
    - එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 54 වැනි සැසිවාරයේදී ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කළ වාර්තාවට අවශ්‍ය කරුණු සැපයීම.

## 3. මාධ්‍ය විෂයය හා සම්බන්ධ කටයුතු

කාන්තාවන් සහ දරුවන් උදෙසා ජාත්‍යන්තර වශයෙන් වෙන්ව ඇති දිනයන්හිදී ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම සිදුකර ඇත. එමෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ප්‍රවෘත්ති, සම්මුඛ සාකච්ඡා ආදිය හරහා කාන්තාවන් සවිබලගැන්වීම සහ ඔවුන් සුරැකීම උදෙසා අමාත්‍යංශය විසින් දියත් කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති, ක්‍රියාකාරකම් පිළිබඳවත්, ප්‍රචාරණ කටයුතු සිදුකර ඇත.

## 4. වැය විෂයයන් යටතේ වැඩසටහන් සිදු කිරීම

- කාර්තුවකට 1 බැගින් දිස්ත්‍රික් 25හි දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබාදී ඇති අතර දිස්ත්‍රික් 23ක පළමු කාර්තු රැස්වීම, දිස්ත්‍රික් 22ක දෙවන කාර්තු රැස්වීම, දිස්ත්‍රික් 22ක තෙවන කාර්තු රැස්වීම හා දිස්ත්‍රික් 15ක සිව්වන කාර්තු රැස්වීම පිළිබඳ රැස්වීම් වාර්තා ලබාදී ඇත.
- ගාල්ල දිස්ත්‍රික්කයේ පාසැල් දරුවන් සඳහා අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීමේ වැඩසටහන් 5ක් හා කෑගල්ල දිස්ත්‍රික්කයේ එක් වැඩටහනක් බැගින් පවත්වා ඇත.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම වෙනුවෙන් වූ වැඩසටහන් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කරන ලදී.
    - යොමු කිරීමේ යාන්ත්‍රණයට (Referral Mechanism) (ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව හිංසනයෙන් වින්දිතයන් බවට පත්වූවන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සේවා වෙත යොමු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් කැඳවමින් සිදුකරන අධීක්ෂණ සහ පසු විපරම් රැස්වීම් 3ක් (කෑගල්ල, මහනුවර,ගම්පහ දිස්ත්‍රික්වල) සහ ප්‍රධාන වැඩමුළු 3ක් (කොළඹ, රත්නපුර හා කළුතර යන දිස්ත්‍රික්කවල) පැවැත්වීම.
    - දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණෙන අවදානමට ලක්වූ කාන්තාවන් සහ ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් හදිසි පිරිවැයක් දැරීමට දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිපාදන සැපයීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332ක් වෙත හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 24කට රු.5000/- බැගින් ලබාදීම.
- ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය සංවර්ධන ප්‍රතිපාදන හදිසි ආධාර ව්‍යාපෘතිය (ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපාදන යටතේ)
    - දිළිඳු හා අවදානම් තත්ත්වයෙන් පෙළෙන ප්‍රජාව වෙත ඍජු මූල්‍ය ආධාර සැපයීම හා එය ප්‍රවර්ධනය කිරීම, ඔවුන් වෙත ජීවනෝපාය සංවර්ධන සහාය ලබාදීම හා සමාජ ආරක්ෂණ පද්ධතීන්හි ඵලදායී බව හා ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම යන ප්‍රධාන උපාය මාර්ග 03ක් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.
    - මේ යටතේ ආයතනගත දරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම, පහසුකම් අඩු ළමා නිවාසයන්හි භෞතික පහසුකම් සංවර්ධනය, තාවකාලික කාන්තා රැකවරණ මධ්‍යස්ථානයන්ට අවශ්‍ය මූලික පහසුකම් ලබාදීම සහ එම මධ්‍යස්ථානයන්හි භෞතික පහසුකම් සංවර්ධනය, අවදානම් සහගත දරුවන් හා කාන්තාවන් සඳහා ආරක්ෂණ සැලසුම්/ ජීවනෝපාය සංවර්ධන සැලසුම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීමද සිදු කරනු ලබයි.
    - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය හා සංවර්ධන අංශය හරහා මෙම කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.
    - ඒ යටතේ නීති ආධාර සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ දැනුවත් කිරීම හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08ක වැඩසටහන් අටක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වූ හා ලක්වීමට අවදානමක් ඇති කාන්තාවන් හා පුරුෂයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට කටයුතු කර ඇත.

## සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### සැලසුම්කරණය

අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, දිස්ත්‍රික් සැලසුම්, ප්‍රධාන කාර්යසාධන සැලැස්ම, තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලැස්ම ඇතුළු කාන්තා හා ළමා ක්ෂේත්‍රයට අදාළ සැලසුම් සකස් කිරීම සිදුකර ඇත. ඊට අමතරව, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා නිර්දේශ අනුව මෙම අමාත්‍යාංශ විෂයය පථය යටතේ විවිධ ආයතන/දෙපාර්තමේන්තු හා වෙනත් අමාත්‍යාංශ මඟින් සකස් කෙරෙන සැලසුම් හා ප්‍රතිපත්ති වෙනත් කාලීන වාර්තා සඳහා තාක්ෂණික සම්පත්දායකත්වය ලබාදීම සිදුකර ඇත.

**මෙහෙයුම්කරණය**

අමාත්‍යාංශයේ සියලු සංවර්ධන වැඩසටහන්වලට අදාළ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්තාකරණය හා ප්‍රගති සමාලෝචන සාකච්ඡා පැවැත්වීම. ඒ යටතේ ප්‍රගති සමාලෝචන රැස්වීම් 12ක් පවත්වා ඇත.

**පසුවිපරම්කරණය**

ගාල්ල, මහනුවර හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ව්‍යවසායකත්ව/ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය කර එම ව්‍යාපෘතීන්හි සාර්ථකත්වය හා තිරසරභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ ඇතුළත් වාර්තා අදාළ ක්‍රියාත්මක ආයතන වෙත ලබාදීම සිදුකර ඇත. තවද නුවරඑළිය දිස්ත්‍රික්කය මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය මැන බැලීම හා මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථානය නිරීක්ෂණ කටයුතුද සිදු කරනු ලැබීය.

**"ලංකා විමෙන් - ඊ මාකට්" ව්‍යවසායකත්ව තොරතුරු හුවමාරුව හා ඊ ඩිරෙක්ටරිය**

ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ඔවුන් ආර්ථිකව සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් නිර්මාණය කරන ලද ඉහත අලෙවිකරණ වේදිකාව හරහා ව්‍යවසායක කාන්තාවන්ගේ වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීමටත් ඔවුන්ගේ නිෂ්පාදන හා සේවාවන් දේශීය මෙන්ම අන්තර්ජාතික වෙළඳපොළෙහි ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමටත් අවස්ථාව සලසා ඇත. මෙම පද්ධතියට (https://lankawomenemarket.gov.lk) යන දිගුව ඔස්සේ පිවිසිය හැකිය. දැනට කාන්තාවන් 329ක් පද්ධතියේ ලියාපදිංචි කර ඇත. පද්ධතියට කාන්තාවන් ඇතුළත් කිරීම පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා පුහුණු සැසි 03ක් පවත්වා ඇත. මේ පිළිබඳ වනිතා සංවර්ධන නිලධාරීන් 316ක් පුහුණු කර ඇත.

මීට අමතරව "ලංකා විමෙන්ඊ මාර්කට්"අලෙවිකරණ වේදිකාවේ ලියාපදිංචි වී සිටින ව්‍යවසායක කාන්තාවන් 53කගේ තොරතුරු ඇතුළත් කර ලංකා විමෙන් ඊ ඩිරෙක්ටරිය සකසා ඇත. එහි ව්‍යවසායක කාන්තාවන්ගේ විස්තර හා ඔවුන්ගේ නිෂ්පාදන ඇතුළත් කර ඇත. එයට අමාත්‍යාංශ යූ ටියුබ් චැනලය (https://youtu.be/gaWNBVryOsk) හා අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවේශ විය හැකිය.

**"සුහුරුකත" සඟරාව**

කාන්තාවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කර ඔවුන් තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් "සුහුරුකත" නම් වූ සඟරා කලාපයක් සිංහල මාධ්‍යයෙන් එළි දක්වනු ලබයි. 2023 වර්ෂය සඳහා සුහුරුකත සඟරාවේ ඊ කලාපයක් එළිදැක්වීම සිදුකර ඇත.

**නිල වෙබ් අඩවිය, යූ ටියුබ් චැනලය හා ෆේස්බුක් පිටුව යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.**

අමාත්‍යාංශයේ කාලීන තොරතුරු සම්බන්ධව නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යාම සිදුකෙරේ. වෙබ් අඩවිය නව මුහුණුවරකින් නව්‍යකරණය කර පවත්වාගෙන යාමට අදාළ කටයුතු සිදුකර ඇති අතර වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම භාෂා ත්‍රිත්වයෙන්ම සිදු කරනු ලබයි.

**එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වූ කෙටි කාලීන පෝෂණ සංවේදී වැඩසටහන**

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් මුලතිව්, කෑගල්ල, කිළිනොච්චි, පුත්තලම, අනුරාධපුර, මොණරාගල, වව්නියාව, නුවරඑළිය හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි මාස 05ත් අවුරුදු 02ත් අතර දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීම සඳහා දියත් කළ ඉහත වැඩසටහන අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

එම වැඩසටහන යටතේ මාස 04ක් දක්වා රු. 6,750/-ක මාසික දීමනාවක් එම දරුවන්ගේ මව්වරුන්/ රැකබලාගන්නන් සඳහා UNICEF ආයතනය මඟින් සෘජුවම ප්‍රතිලාභී පවුල් වෙත ලබාදීමට කටයුතු කර ඇත.

**දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- **කෘතිම බුද්ධිය පිළිබඳවපුහුණුවැඩසටහන්**

  ළමා හිංසනයන් වළක්වාගැනීම උදෙසා ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන් මාලාවට සමගාමීව කාන්තා හා ළමා ආරක්ෂාව වෙනුවෙන් කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ සියලුම දිස්ත්‍රික් නිලධාරීන් හා අමාත්‍යාංශයීය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්පත් දායකත්වයෙන් පැවැත්විණි.

- **තොරතුරු තාක්ෂණ පුහුණුව**

  තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම හා පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් 20ක් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා භෞතිකව හා මාර්ගගතව පවත්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශ නිලධාරීන් මෙම පුහුණු වැඩසටහන් ඔස්සේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා ඇත.

- **"සුහුරුලිය " වැඩසටහන**

  "සුහුරුලිය" ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය ඒකාබද්ධව 2017 වසරේ ආරම්භ කර මේ දක්වා ක්‍රියාත්මක වන කාන්තා ප්‍රජාව තොරතුරු තාක්ෂණයෙන් සවිබලගන්වන කාලීන වැඩසටහන් මාලාවක එක් අංගයකි. මෙම වැඩසටහන මඟින් විශේෂයෙන්ම ව්‍යවසායකයන් ලෙස ඉදිරියට එන කාන්තාවන් හට තොරතුරු තාක්ෂණ දැනුම, අන්තර්ජාල භාවිතය හා ඩිජිටල් අලෙවිකරණ භාවිතය පිළිබඳව ලබාදෙන දැනුම රටේ සංවර්ධන කටයුතු සඳහාද බොහෝ සෙයින් ඉවහල් වේ. "සුහුරුලිය" පළමු අදියර සාර්ථක නිමාවෙන් පසු දෙවන අදියරට අදාළ උපායමාර්ග සැලැස්ම සකස් කිරීම අප අමාත්‍යාංශයේද මැදිහත්වීමෙන් සිදු කරන ලදී.

## මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

**1. ගර්භණී හා කිරිදෙන මව්වරුන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් හා ප්‍රතිලාභ**

- **ගර්භණී මව්වරුන්ට රුපියල් 45,000/-ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන**

පවුලේ මාසික ආදායම රු.50,000/- සීමාව නොඉක්මවන මව්වරුන් සඳහා ගර්භණී සමයේ අවසන් මාස 06 හා කිරිදෙන සමයේ පළමු මාස 04 සඳහා අවශ්‍ය පෝෂණීය ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට රු.45,000/-ක් වටිනා වවුචර් නිකුත් කෙරේ. 2023 වර්ෂයේදී දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක මෙම වැඩසටහන යටතේ 2023.12.31 දින වනවිට ගර්භණී මව්වරුන් 231,346ක් සඳහා දරණ ලද වියදම රු.මි. 5,999,333ක් වේ.

- **පෙයාර්ස් බිළිඳු සත්කාර වැඩසටහන**

අඩු ආදායම් සහිත තෝරාගත් මව්වරුන් සඳහා ළදරු සනීපාරක්ෂක භාණ්ඩ (රු.4500/-ක වටිනාකමකින් යුතු) ලබාදීම හා මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක කරන ලදී. එහිදී කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 1225, ගම්පහ

දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 1181, කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 1288, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 150ක් සහ යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 150ක් ලෙස මුළු ප්‍රතිලාභීන් 3,994ක් සඳහා යුනිලීවර් ආයතනයේ අනුග්‍රහය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

## 2. පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් හා ප්‍රතිලාභ

- **පෙර පාසල් ගුරුවරියන් සඳහා මාසික දීමනාවක් ලබාදීමේ වැඩසටහන - ගුරු අභිමාණී**

පෙර පාසල් ගුරුවරියන්ගේ සේවය ඇගයීම හා ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන පෙර පාසල් ගුරුවරියන්ට මාසික දීමනාවක් ලබාදීමේ ගුරු අභිමාණී වැඩසටහන 2023 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කළ අතර, 2023.12.31 දිනට ප්‍රතිලාභී ගුරුවරියන් 15,638ක් සඳහා දරණ ලද වියදම රු.මි.424.219කි.

- **පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන නියාමනය හා අධීක්ෂණය අනු කමිටුව**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ගුරු ඩිප්ලෝමා ආයතන 63හි පවතින ගැටළු සම්බන්ධව නැවත පරීක්ෂා කර අඩුපාඩු සකස් කිරීම සහ නව ලියාපදිංචිය ඉල්ලා සිටින ගුරු පුහුණු ඩිප්ලෝමා ආයතන ලියාපදිංචිය සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම මෙම අනු කමිටුවේ ප්‍රධාන අරමුණ වන අතර 2023 වර්ෂය සඳහා අනු කමිටු වාර 03ක් පවත්වා ඇත. එම ආයතන පරීක්ෂා කිරීම සඳහා නිර්ණායක සකස් කර අවසන් කර ඇති අතර එම නිර්නායක පදනම් කරගෙන ගුරු පුහුණු පාඨමාලා නියාමනය කිරීමට අදහස් කර ඇත.

## 3. පෙර පාසල් දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් හා ප්‍රතිලාභ

- **පෙර පාසල් දරුවන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාරවේලක් ලබාදීමේ වැඩසටහන**

පෙර පාසල් වියේ පසුවන අඩුබර සහිත දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීමේ අරමුණ මත 2022 අගෝස්තු 01 දින සිට 2023 මැයි 15 දක්වා ලෝක බැංකු ව්‍යාපෘතියේ මූල්‍යාධාර මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර 2023 මැයි 15 දින සිට ලෝක බැංකු ව්‍යාපෘතිය අවසන් වීම හේතුවෙන්, මෙම වැඩසටහන 2023 මැයි 15න් පසු භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක විය. 2023 වර්ෂයේ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වතු සහ වතු නොවන ක්ෂේත්‍ර තුළද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. 2023.12.31 දින වනවිට වතු නොවන පෙර පාසල් 4487ක් තුළ දරුවන් 129,914ක් සහ වතු පෙර පාසල් 215ක් තුළ දරුවන් 4219ක් සඳහා දරණ ලද මුළු වියදම රු.මි.707.631ක් වේ.

## 4. ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන්

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව**

ජාතික මට්ටමේ සැලසුම් සම්පාදනයේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ කාර්යයන්වලදී ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා බහු ආංශික සහයෝගීතාවය සහතික කිරීම හා මුල් ළමාවිය සංවර්ධනය හා ජාතික මට්ටමේ තීන්දු තීරණ ගැනීම මෙම කමිටුවෙහි අරමුණ වන අතර 2023.12.31 දින වනවිට සියලු පාර්ශවයන් නියෝජනය කරමින් කමිටු වාර 3ක් පවත්වා ඇත.

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018 ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.**

මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2018 ක්‍රියාත්මක කිරීම සඳහා වන පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම මේ වනවිට යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහය මත අවසන් කර ඇත. ඒ අනුව 2024 -2028 දක්වා, සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධ කර ගනිමින් මෙම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- **මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ කාර්යයභාරයේ ඵලදායීත්වය ඇගයීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වෙමින් මාසික හා කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. ඒ අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ කාර්තුවකට 1 බැගින් කාර්තු 4 අවසානයේ රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.

- **නිවස පදනම් කරගත් මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය**

තෝරාගත් පවුල් ඒකක සඳහා අවශ්‍ය මැදිහත්කරණයහා මඟ පෙන්වීම තුළින් නිවස තුළ දරුවාගේ උපරිම යහපත හා සංවර්ධනයට ඉඩ සැලසෙන ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම, දෙමාපියන් හා රැකබලාගන්නන්ගේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය හා සම්බන්ධ දැනුවත්භාවය ඉහළ නැංවීම තුළින් දරුවාගේ සමස්ත සංවර්ධනය තහවුරු කිරීම, පවුල තුළ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම තුළින් ළමා මන්දපෝෂණය අවම කිරීම, අවදානම් සහගත සහ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් මුල් කාලීනව හඳුනා ගැනීම හා අවශ්‍ය සේවාවන් සඳහා යොමුකිරීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී 2023 වර්ෂය සඳහා සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර 2023.12.31 වනවිට පවුල් ඒකක 630ක් බලගැන්වීමට කටයුතු කර ඇත.

## 5. ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- **එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ප්‍රමිතිගත පෙර පාසල් පහක් ඇති කිරීමේ ව්‍යාපෘතිය**

මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුණාත්මක හා භෞතික සංවර්ධනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමේ අරමුණින් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා ජාතික ප්‍රමිති යාවත්කාලීන කර ඇති අතර, එයට සමගාමීව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි එක් කොට්ඨාශයකින් අවම ප්‍රමිති මට්ටමට ළඟාවී නොමැති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 4ක් බැගින් තෝරා ගනිමින් ඒවා ප්‍රමිතිගත මට්ටමට ළඟා කිරීමටත්, සෞඛ්‍ය ප්‍රවර්ධිත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමටත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කෙරේ.

එසේම, 2023 වර්ෂයේදී, සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1356ක් ඉලක්ක කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර 2023.12.31 දින වනවිට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 1060ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

2023 අගෝස්තු මස කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 09ක් සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදුකරන ලදී.

- **මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ ජාතික සතිය**

සෑම වර්ෂයකම ජූලි මස 14 දින සිට 20 දින දක්වා මුල් ළමාවිය විෂයය හා සම්බන්ධව වගකිවයුතු සියලු පාර්ශවයන් ඒකරාශී කර ගනිමින්, මුල් ළමාවිය දරුවන්ගේ ආරක්ෂාව, රැකවරණය හා සංවර්ධනය

ඉලක්ක කරගත් වැඩසටහන් ජාතික, පළාත්, දිස්ත්‍රික්ක සහ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීම සිදු කරයි. ඒ අනුව, 2023 වර්ෂයේ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය පිළිබඳ ජාතික සතිය සැමරීම "මුල් ළමාවිය පුබුදුවන්නට සැවොම එක්වෙමු සෙනෙහසින්" තේමාව ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක විය. ඒ යටතේ,

- මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ සෙත්සිරිපාය අදියර 1 සහ අදියර 2හි අංශ 25ක නිලධාරීන් 500ක් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදකයන් සමඟ මුල් ළමාවිය ජාතික ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුවක් පැවැත්වීම.
- ගර්භණී මව්වරුන් 200ක් ඉලක්ක කර ගනිමින් කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන සහ එම වැඩසටහනට සමගාමීව බස්නාහිර පළාත තුළ (කළුතර, ගම්පහ, කොළඹ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40ක ගර්භණී මව්වරුන් 40,000ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් යුනිලීවර් ආයතනයේ අනුග්‍රහය මත සිදු කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 255ක් තුළ පැවැත්වීම.

➢ **ලෝක ළමා දිනය සැමරුම් වැඩසටහන**

ලෝක ළමාදින ජාතික වැඩසටහන - 2023 සමගාමීව "සියල්ලටම වඩා දරුවන් වටී" යන තේමාව යටතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ නිවස පදනම් කරගත් මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 322ක මෙම වැඩසටහන පවත්වා ඇති අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 47,461කි.

➢ **ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් මාධ්‍යය මඟින් මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳව වීඩියෝ සහ සටහන් මඟින් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (Face book and YouTube (Videos, Post) Media Promotion)**

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිල ෆේස්බුක් පිටුව සහ යූ ටියුබ් නාලිකාවක් ක්‍රියාත්මක කරනු ලබයි. (NSECD Face book, NSECD YouTube Channel) ඒ යටතේ මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනයට අදාළව සකස් කරන ලද පෝස්ට් හා වීඩියෝපට දැනුවත් කිරීමේ සටහන් 71ක් සමාජ මාධ්‍යය වෙත 2023 වර්ෂය අවසාන වනවිට මුදාහැර ඇත.

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

➢ **1929 ළමා උපකාරක දුරකතන සේවය**

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙමඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට අදාළ මහජන පැමිණිලි භාරගැනීමද පැය 24 පුරාම සිදු කරයි. 2023.12.31 දින වනවිට 1929 දුරකතන සේවාව වෙත ඇමතුම් 119,173ක් ලැබී ඇති අතර, පැමිණිලි ලෙස ඇමතුම් 8,469ක් ලැබී ඇත. මේ සඳහා සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.850 කි.2023.12.31 වන විට දරා ඇති වියදම රු. මිලියන 0.428කි.

➢ **පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරකුම් පව්ව)**

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයන්ගෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ අරමුණු වේ. මෙහිදී 2011 අංක 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

මෙම වැඩසටහන සිදුකරයි. 2023 වසරේදී පාසල් ආරක්ෂණ කමිටු 783ක් ස්ථාපිත කර ඇති අතර, පාසල් ළමා ආරක්ෂක කමිටු ඇගයීම් ක්‍රියාවලියට ලියාපදිංචි පාසල් සංඛ්‍යාව 986 කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 61,590 කි. මේ සඳහා සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 3 කි. 2023.12.31 වන විට දරා ඇති වියදම රුපියල් මිලියන 2.804කි.

- **ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම.**

- 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ඊ) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම මඟින් කාලානුරූපීව හරයාත්මක නීතිය සංශෝධනය කිරීම තුළින් ළමා අපයෝජන අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම මෙහි මූලික අරමුණ වේ.

- ලිංගික අපයෝජනයට ලක්වන ගැහැණු ළමයින්ගේ ගර්භණීභාවය වෛද්‍ය හේතූන් මත අවසන් කිරීම සම්බන්ධයෙන් දැනට පවතින නීතිය සංශෝධනයට අදාළව ඉදිරි පියවර, පොදු ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යන සේවා හිමිකරුවන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් වන නීතියක්, රෙගුලාසියක් හෝ මාර්ගෝපදේශයක් පවතීදැයි සොයා බැලීම, ළමා අපයෝජන වැරදි සඳහා වැරදිකරුවන් වූ තැනැත්තන් ළමයින් සමඟ රාජකාරී කිරීම වළක්වාලීම සඳහා නෛතික ප්‍රතිපාදන හඳුන්වාදීම හා ළමයින් සඳහා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් වන කරුණුද අධ්‍යයනය කරමින් අදාළ පාර්ශවයන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරමින් පවතී. මේ සඳහා සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියනයකි. 2023.12.31 දින වන විට දරා ඇති වියදම රුපියල් මිලියන 0.856කි.

- **විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම.**

ළමා අපයෝජනවලින් වින්දිත වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සිද්ධි සම්බන්ධව විශේෂ විමර්ශනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රයේ ඇති විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් සිදුකරනු ලබයි. මේ වනවිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය අධිකරණයේ පෙනී සිටීම් 2,158 ක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 37ක් සිදුකර ඇති අතර, පුද්ගලයින් 1,419කට නීතිමය සහාය ලබාදී ඇත. සයිබර් නිරීක්ෂණ පැමිණිලි 150ක් ලැබී ඇත. සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 3.50 කි. 2023.12.31 දින වන විට දරා ඇති වියදම රුපියල් මිලියන 6.015කි.

- **ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම.**

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත්වන ළමුන් ද්විතීයික වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රයේපිහිටුවා ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයේ හා දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමාපියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීම ඒකකය මඟින්ද ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදු කරයි. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 242 ක් අවසන් කර ඇත. අධිකරණය වෙත පටිගත කරන ලද වීඩියෝ පට 222ක් මුදාහැර ඇත. සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියනයක් වන අතර 2023.12.31 දින වනවිට දරා ඇති වියදම රුපියල් මිලියන 0.785කි.

- **ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජයීය උපකාර සේවාව.**

වින්දිත ළමුන් ප්‍රමාණය අවම කිරීම හා ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැළැක්වීම, අධ්‍යාපනය සඳහා සහාය සහ කායිකව හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමඟින් ළමා කේන්ද්‍රීය මනෝ සමාජයීය සහායන් ළමයින්ට ලබාදෙය ළමුන් 783ක් සඳහා මනෝ සමාජයීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇති අතර, පසු විපරම් 397ක් සිදුකර ඇත. එමෙන්ම ඊට අමතරව මනෝ සමාජයීය උපදේශන 157ක් හා සිද්ධි සම්මන්ත්‍රණ 26ක් පවත්වා ඇත. සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියනයක් වන අතර 2023.12.31 දින වනවිට දරා ඇති වියදම රුපියල් මිලියන 1.369 කි.

- **කැපකරු සත්කාර වැඩසටහන යටතේ සුනාමියෙන් විපතට පත්වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම**

2005 අංක 16 දරන සුනාමි විශේෂ විධි විධාන පනත යටතේ සුනාමි ව්‍යසනයෙන් වින්දිතභාවයට පත්වූ ළමුන්ගේ භාරකාරිත්වය පරීක්ෂාවට ලක්කරමින් ළමුන්ගේ උපරිම යහපත තහවුරු කෙරෙන භාරකාරිත්වය හා රැකවරණය සඳහා නිර්දේශ සැපයීම සහ සැමට අධ්‍යාපනය යන තිරසර තේමාව යටතේ සුනාමි ව්‍යවසනයෙන් වින්දිත, ආන්තික හා අනාරක්ෂිත භාවයට පත්වූ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම හා ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මේ යටතේ දැනට ළමුන් 17 දෙනෙකු සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම සිදුකරන අතර, සුනාමි මණ්ඩල 02ක් පවත්වා ඇත. සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියයක් වන අතර 2023.12.31 දින වනවිට දරා ඇති වියදම රුපියල් මිලියන 0.569කි.

- **ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ළමයින් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් හා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත. ළමා සංවර්ධන මධ්‍යස්ථාන 306ක් අධීක්ෂණය හා නියාමනය කිරීම සිදුකරන ලදී. සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියනයක් වූ අතර 2023.12.31 දින වන විට දරා ඇති වියදම රුපියල් මිලියන 0.658කි.

- **දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- **පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන" හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා "විශ්වවිද්‍යාල තානාපති" ජාතික වැඩසටහන**

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සහ විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබාගැනීම සහ පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකෙරේ. නව ලියාපදිංචි පාසල් සංඛ්‍යාව 532ක් වන අතර. දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති පුහුණු වැඩසටහන් 24ක් හා දිස්ත්‍රික් සමුළු 09 පැවැත්වීමට කටයුතු කර ඇත.

විශ්වවිද්‍යාල තුළ ළමා ආරක්ෂාව පිළිබඳ ළමයින් සහ ප්‍රජාව දැනුවත් කිරීමට දායකත්වය ලබා ගැනීම සහ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී දායකත්වය ලබා ගැනීම සහ ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම ආදිය මෙයින් අපේක්ෂා කරයි. විශ්වවිද්‍යාල සිසුන් 2265ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් පවත්වා ඇත. ඉහත වැඩසටහන් දෙක සඳහා සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 3.50 වූ අතර දරන ලද මුළු වියදම රුපියල් මිලියන 2.696කි.

- **අදාළ ළමා ආරක්ෂණ ක්ෂේත්‍ර 10 තුළ ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ උපදේශනය, දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සහ මෙවලම් සංවර්ධනය කිරීම**

මෙම වැඩසටහන් යටතේ පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන්, විද්‍යාපීඨ ගුරුසිසුන් හා කාර්යය මණ්ඩල සාමාජිකයන් හා සෞඛ්‍ය නිලධාරීන් විසින් ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් වඩාත් සංවේදී වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම මෙහි මූලික අරමුණ වේ. 2023 වර්ෂයේදී වැඩසටහන් 16ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3571කි. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 1.20 ක් වූ අතර, දරන ලද මුළු වියදම රු. මිලියන 1.143කි.

- **ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම.**

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ. මේ යටතේ එක්දින පුහුණු වැඩසටහනක් හා දැනුවත් කිරීමේ වැඩසටහන් 40ක් පවත්වා ඇත. ප්‍රතිලාභීන් ගණන 1918කි. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 2 කි. දරන ලද වියදම රු. මිලියන 1.94 කි.

- **ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන්**

මෙම වැඩසටහන් යටතේ ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන් සහ ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියන 3.500කි. රුපියල් මිලියන 3.058ක වියදමක් දරමින් වැඩසටහන් 165ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 7880කි.

මෙම ප්‍රධාන වැඩසටහන්වලට අමතරව ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනයන්ට ගොදුරුවූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම, ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය සහ සන්නිවේදන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- **එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)**

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මඟින් ළමා ආරක්ෂාව සඳහා ළමා/උපකාරක දුරකථන සේවාවේ මෙහෙයුම් කටයුතු සඳහා දරන ලද වියදම් රු. මිලියන 3.142 කි. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 7.500 කි.

## ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

- කාන්තාවන්ට එකම සංවිධානයක් තුළ ක්‍රියාත්මක වීම සඳහා (Smooth Functioning) ප්‍රජාමූල මට්ටමේ සිට ජාතික තලය දක්වා කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරීම යටතේ නව ජාතික කාන්තා බල මණ්ඩල ව්‍යවස්ථාව පිහිටුවීම.
- අයවැය යෝජනා 48.1 යටතේ වැන්දඹු කාන්තාවන් ගෘහ ව්‍යවසායකයන් ලෙස ශක්තිමත් කිරීම සඳහා රු.මිලි.62.5ක ප්‍රතිපාදන යොදා ගනිමින් ව්‍යාපෘති 639ක් ක්‍රියාත්මක කිරීම.
- අයවැය අංක 65.1 අවිධිමත් කුටුම්භ ව්‍යාපාරවල නියැලෙන තරුණ කාන්තා ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

- නව තාවකාලික රැකවරණ මධ්‍යස්ථානයක් මොණරාගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීම.
- 2023 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තා ව්‍යවසායිකාවන් 200කගේ සහභාගීත්වයෙන් ව්‍යවසායක නිෂ්පාදන ප්‍රදර්ශනයක් හා අලෙවි පොළක් පැවැත්වීම.
- 2023 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව දිස්ත්‍රික්ක 25 නියෝජනය වන පරිදි 'හොඳම කාන්තා ව්‍යවසායිකාව' හඳුනාගැනීම සහ ඇගයීම.
- වනිතා සංවර්ධන නිලධාරීන් සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනය හරහා UNFPA ආයතනයේ අනුග්‍රහයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම

ඒ අනුව කාන්තාවන් එකම ජාලයක් තුළ සංවිධානගත කිරිම. ශ්‍රී ලාංකීය කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා සුදුසු වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම මෙන්ම ඇගයීමද සිදුකරනු ලබයි. ඒ යටතේ,

- නාගරික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අරමුණු කර ගනිමින් 2023 වර්ෂයේදී ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 16කි. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 1.70ක් වූ අතර එහි දරන ලද වියදම රු. මිලියන 1.66කි.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ගෘහමූලික කාන්තා පවුල් බලගැන්වීම සඳහා වූ ජාතික මධ්‍යස්ථානය ඉලක්ක කර ගනිමින් පැවැත්වූ වැඩසටහනක් මඟින් ව්‍යාපෘති 02ක් ක්‍රියාත්මක කළ අතර ප්‍රතිලාභීන් ගණන 08කි. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන එකක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.97කි.
- දිරිය මංපෙත වැඩසටහන යටතේ ව්‍යාපෘති 21 ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 170කි. එහිදී අපේක්ෂිත භෞතික ඉලක්කය ව්‍යාපෘති 18ක් වුවද ඉදිරිපත් වූ ව්‍යාපෘතිවල වටිනාකම අනුව වෙන්ව ඇති ප්‍රතිපාදන සීමාව තුළ නව ව්‍යාපෘති 03ක් ද ක්‍රියාත්මක කළහැකි විය. සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 6.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 6.13කි.
- විශේෂ ව්‍යාපෘති තුළින් කාන්තාවන් සවිබලගැන්වීම යටතේ ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිලාභීන් 27 දෙනෙකි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 3.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 1.99කි.
- ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්තයට කාන්තාවන් සම්බන්ධ කරගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති 20ක් ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රතිලාභීන් ගණන 20කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.5කි.
- පශ්චාත් ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (කාන්තා කාර්යය සංවිධාන සඳහා) යටතේ ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභීන් ගණන 04කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.2ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.2කි.
- ගෘහසේවය සඳහා මැදපෙරදිග රාජ්‍යයන්හි රැකියාවන් සඳහා විදේශගතවන කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා විකල්ප ආදායම් උත්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිලාභීන් ගණන 10කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.5කි.
- විශේෂිත හේතූන් මත සමාජ සංවේදීතාව අහිමි වූ කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ සවිබලගැන්වීම. ("ජීවිතයට අරුතක් ") වැඩසටහන ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘති 31ක් ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිලාභීන් ගණන 31කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 1.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 1.41කි. භෞතික ඉලක්කය ලෙස ව්‍යාපෘති 15ක් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හා ඒ එක් ව්‍යාපෘතියක් සඳහා රුපියල් ලක්ෂයක් බැගින් ලබාදීමට සැලසුම් කළද මිල ගණන්වල වැඩිවීම නිසා කුඩා පරිමාණයේ ව්‍යාපෘති වැඩි ගණනක් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.

- බන්ධනාගාර ගතවූවන්ගේ පවුල් සඳහා සහන සැලසීමට එම පවුල් දැනුවත් කිරීම උදෙසා ව්‍යාපෘති 8ක් හා පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර, එහි ප්‍රතිලාභීන් ගණන 08කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.5කි.
- වතු අංශයේ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කරන ලද අතර එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 0.5ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.5කි.
- නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන් සඳහා සහන සැලසීම යටතේ ව්‍යාපෘති 76ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද එක් ව්‍යාපෘතියක් සඳහා වෙන්කළ උපරිම මුදල රු.50,000ක් වූ අතර, ඊට වඩා අඩුවෙන් ව්‍යාපෘති සඳහා වියදම් වූ බැවින් ඉතිරි මුදලින් තවත් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලද අතර ඒ අනුව 2023 වර්ෂයේදී ව්‍යාපෘති 86ක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. එහි ප්‍රතිලාභීන් ගණන 93කි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියන 3.8ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 3.73කි.
- කාන්තා දිනයට සමගාමී ව්‍යවසායක කාන්තා සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ ප්‍රධාන උත්සවය හා සමගාමී වැඩසටහන් පවත්වන ලද අතර, එහි සමස්ත මූල්‍ය ඉලක්කය රු.මිලියනයක් විය. නමුත්, මේ සඳහා Unilever, UNFPA, UN Women යන ආයතන විසින් අනුග්‍රාහක දායකත්වය ලබාදෙමින් රු. මිලි.4.31ක් ප්‍රතිපාදන දරණ ලදි.
- වෙළඳපොළ ප්‍රවර්ධනය හා කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශන හා වෙළඳ පොළ පැවැත්වීම යටතේ කාන්තා දිනයේ ප්‍රධාන උත්සවය පැවැත්වීම හා දිස්ත්‍රික්ක 25හි ව්‍යවසායකයින් 25දෙනෙකු ඇගයීමට ලක්කිරීම සිදුවිය. මීට සමගාමීව වෙළඳ ප්‍රදර්ශන හා ජංගම අළෙවි කුටි පැවැත්වීමට ඉලක්කගතව තිබුණද පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ඒ සඳහා ප්‍රතිපාදන නිකුත් කිරීමට භාණ්ඩාගාර අනුමැතිය හිමි නොවුණි.
- ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන් 31ක් පවත්වමින් ප්‍රතිලාභීන් 775 දෙනෙකු සඳහා ප්‍රතිලාභ හිමිකරදෙන ලද අතර ඉලක්කගත කරන ලද වැඩසටහන් ගණන 30කි. එක් ව්‍යාපෘතියක් සඳහා වෙන්කළ උපරිම මුදලට වඩා අඩුවෙන් ව්‍යාපෘති සඳහා වියදම් වූ නිසා ඉතිරි මුදලින් තවත් ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.
- වයස අවුරුදු 18ට වැඩි ගැහැණු ළමුන් සඳහා ජීවනෝපාය සහ සුභසාධන පහසුකම් සැපයීම යටතේ පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර එහි ප්‍රතිලාභීන් ගණන 12කි. ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා මෙම පුහුණු වැඩසටහන ලබාදීමට අපේක්ෂා කර තිබුණද පුහුණුව සඳහා ඉල්ලුම් කරන ලද ළමුන්ගෙන් සුදුසුකම් සපුරා තිබුණේ 12 දෙනෙකු පමණි. එහි සමස්ත මූල්‍ය ඉලක්කය රුපියල් මිලියනයක් වූ අතර දරන ලද වියදම රු. මිලියනයකි.
- ආබාධිත කාන්තාවන් සඳහා ජීවනෝපාය සංවර්ධන සවිබලගැන්වීම යටතේ ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළද 2023 වර්ෂය අවසන් වනවිට ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා ව්‍යාපෘති 20ක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. එක් ව්‍යාපෘතියක් සඳහා රුපියල් ලක්ෂයක් බැගින් ලබාදීමට සැලසුම් කළද මිල ගණන්වල වැඩිවීම නිසා කුඩා පරිමාණයේ ව්‍යාපෘති වැඩි ගණනක් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.
- පුවත්පත්, සඟරා, පොත්, කාන්තා දින කාන්තා සවිය සඟරා 150, රාජකාරි වාර්තා පොත් 100ක මුද්‍රණ වියදම්, වෙබ් සත්කාර දුරකථන ගාස්තු ගෙවීම් වැනි මාධ්‍ය කටයුතු සඳහා 2023 වර්ෂය තුළ මූල්‍ය ඉලක්කය රු.මිලියන 2.4ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 2.39කි.
- අධීක්ෂණය සහ පසුවිපරම සහ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය යටතේ දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 20ක්, අධීක්ෂණය සහ පසු විපරම් 50ක් පැවැත්වීමට සැලසුම් කළද වියදම් කළමණාකරණය සහ මාර්ගගතව රැස්වීම් පැවැත්වීම සහ ලිඛිතව උපදෙස් යැවීම හේතුවෙන් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 6ක් පවත්වන ලද අතර කොළඹ, කළුතර, ගම්පහ අධීක්ෂණය සහ පසු විපරම් 03ක් පැවැත්වීය. ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව 187කි. ඒ සඳහා වූ මූල්‍ය ඉලක්කය රු.මිලියන 1.2ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 0.13කි.

- ළමා අපයෝජනය හා කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම වැඩසටහන ක්‍රියාත්මක කරමින් ගම්පහ, රත්නපුර, කොළඹ, මාතර, මඩකළපුව, මුලතිව්, යාපනය සහ අනුරාධපුර - (මධ්‍යස්ථාන 02කි) යන දිස්ත්‍රික්කයන්හි පිහිටුවා ඇති කාන්තා රැකවරණ මධ්‍යස්ථාන 09 පවත්වාගෙන යාම වෙනුවෙන් වන වියදම් දරා ඇති අතර එම මධ්‍යස්ථානයන්හි සේවාලාභීන් 509ක් රැකවරණය ලබා ඇත. ඒ සඳහා වූ මූල්‍ය ඉලක්කය රු.මිලියන 12.497ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 11.947කි.
- කළුතර, අනුරාධපුරය, මොණරාගල, නුගතලාව, කුරුණෑගල, රත්නපුර, කටුනායක, කෑගල්ල, මාතර, ගාල්ල, මහනුවර හා ගම්පහ පවත්වාගෙන යනු ලබන උපදේශන මධ්‍යස්ථාන 12හි පරිපාලන වියදම් දැරීම සඳහා වූ මූල්‍ය ඉලක්කය රු.මිලියන 1.203ක් වූ අතර දරන ලද වියදම රු. මිලියන 1.200කි. 2023 වර්ෂය තුළදී මෙම මධ්‍යස්ථාන වෙතින් සේවාලාභීන් 2901ක් උපදේශනය ලබා ඇත.

## ජාතික කාන්තා කමිටුව

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

#### දේශීය ප්‍රතිපාදන භාවිතා කරමින් සිදුකරන ලද වැඩසටහන්

- **සයිබර් ප්‍රචණ්ඩත්වය, ප්‍රවාහනයේදී සිදුවන හිරිහැර සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන**

පොදු ප්‍රවාහනයේදී හා අන්තර්ජාලය තුළ නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා නව යොවුන්විය තුළ ඔවුන් මුහුණදෙන අභියෝග ජය ගැනීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන 2023 වර්ෂයේදී කුරුණෑගල, මහනුවර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හිදී පවත්වන ලදී.

- **විවාහ අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා පූර්ව විවාහ පිළිබඳ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (ප්‍රීතිමත් පවුල් ජීවිතයක් සඳහා)**

විවාහයෙන් පසු පවුල් ජීවිතය තුළ ඇති වන ගැටුම් අවම කර ගනිමින් සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපදේශනය ලබාදීමේ අරමුණින් 2023 වර්ෂයේදී හම්බන්තොට, මොණරාගල, අම්පාර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල වැඩසටහන් පවත්වන ලදී.

- **රැකියා ස්ථානයේ ලිංගික හිංසනය අවම කිරීම සඳහා කාර්මික ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් දැනුවත් කිරීම**

රැකියා ස්ථානයන්හි කාන්තා හිංසනය අවම කිරිම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇතුළු පෞද්ගලික ආයතනවල සේවක සේවිකාවන් හා නිලධාරීන් සඳහා වැඩසටහන් පවත්වන ලදී. මෙම වර්ෂයේදී කුරුණෑගල, ගම්පහ, ගාල්ල, කෑගල්ල හා කොළඹ යන දිස්ත්‍රික්කවල වැඩසටහන් 11ක් පවත්වා ඇත.

- **දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා සහ ළමා සංවර්ධන ඒකකයන්හි නිලධාරීන් පුහුණුකරුවන් ලෙස ධාරිතා සංවර්ධනය කිරීම**

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව 2023 වර්ෂයේදී කළුතර, කුරුණෑගල හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි සයිබර් අපරාධ වැළැක්වීම සම්බන්ධව, අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනය සහ සයිබර් අපරාධ අවම කිරීම සඳහා යොවුන් පාර්ලිමේන්තු සාමාජිකයින් බලමුළු ගැන්වීමේ ධාරිතා සංවර්ධන වැඩසටහන**

අන්තර්ජාලය භාවිතයේදී නව යෞවන යෞවනියන්ට සිදුවන හිංසනයන් වැළැක්වීම හා එවැනි ගැටළුවලට සාර්ථකව මුහුණ දියයුතු ආකාරය පිළිබඳව අවශ්‍ය දැනුම ලබාදීමේ අරමුණින් සහ එම දැනුම ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියින් අතරට ගෙන යෑමේ අරමුණින් යොවුන් පාර්ලිමේන්තු සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් මහරගම තරුණ සේවා සභාවේදී පවත්වන ලදී.

- **දේශපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් බල ගැන්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කාන්තා බලමණ්ඩලවල නියෝජිතයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන**

දේශපාලනයට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්පවලින් හෙබි කාන්තා නායිකාවන් බිහිකිරීම හා දේශපාලනයට අවතීර්ණවීම සඳහා කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණින් දිස්ත්‍රික්ක 21ක් තුළ මෙම වැඩසටහන සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහන් දෙදින පුහුණු වැඩසටහනක් ලෙස පවත්වන ලද අතර එහිදී කාන්තාවන් හට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලදී.

## විදේශීය ප්‍රතිපාදන (UNFPA) භාවිතා කරමින් සිදු කරන ලද වැඩසටහන්

- **පොදු ප්‍රවාහනයේ දී සිදුවන හිංසනයන් අවම කිරීමේ වැඩසටහන්**

"සැමට සුන්දර ගමනක්" පොදු ප්‍රවාහනයේ දී කාන්තාවන්ට සිදුවන හිංසන ක්‍රියා වැළැක්වීමේ අරමුණින් මෙම වර්ෂයේදී කොළඹ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් පවත්වන ලදී.

## දේශීය හා විදේශීය ප්‍රතිපාදන (UNFPA) භාවිතා කරමින් සිදු කරන ලද වැඩසටහන්

- **කාන්තා හිංසනය වැළැක්වීම සඳහා වන අන්තර් ජාතික දින 16 වැඩසටහන**

කාන්තා හිංසනය වැළැක්වීමේ අන්තර්ජාතික දින 16ට සමගාමීව 2023 වර්ෂයේදී ජාතික කාන්තා කමිටුව මඟින් දේශීය හා විදේශීය අරමුදල් (UNFPA අරමුදල්) භාවිතා කරමින් ජංගම සේවා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. එහිදී දේශීය අරමුදල් භාවිතා කරමින් රත්නපුර දිස්ත්‍රික්කයේ ජංගම සේවාවක් පවත්වන ලද අතර විදේශීය අරමුදල් භාවිතා කරමින් ජංගම සේවා දෙකක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ යාපනය දිස්ත්‍රික්කයේ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යන ස්ථානයන්හි පවත්වන ලදී. එහිදී, ගැබිණි මව්වරුන්ගේ දරු ප්‍රසූතිය සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබාදීම, උපදේශන සේවා, නීති සේවා, සෞඛ්‍ය සායන, ඇස්කණ්නාඩි ලබාදීම සහ ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන් පවත්වන ලදී. පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී, පූර්ව විවාහ උපදේශන හා කුට්ටනය පිළිබඳ මාතර දිස්ත්‍රික් තරුණ සේවා සභාව තුළ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් දැනුවත් කිරීම හා මහනුවර, ගාල්ල, කුරුණෑගල හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි උපකාරක පන්තිවල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා සයිබර් අපරාධ වැළැක්වීම සම්බන්ධව දැනුවත් කිරීම් සිදුකරන ලදී.

- **වතු අධිකාරී ඇතුළු වතු කළමනාකරණයේ සේවයේ නියුතු පිරිස් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා ළමා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

වතුප්‍රජාව වෙත වඩාත් යහපත් ජීවන මට්ටමක් හා තෘප්තිමත් රැකියා පරිසරයක් ගොඩනැගීම සඳහා ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන හා ළමා අයිතිවාසිකම් හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ වතු අධිකාරී ඇතුළු වතු කළමනාකරණ මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. ඒ අනුව 2023 වර්ෂයේදී නුවරඑළිය, කළුතර, බදුල්ල හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි

මෙම වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා දේශීය ප්‍රතිපාදන මෙන්ම UNFPA ප්‍රතිපාදන ද භාවිතා කරන ලදී.

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම**

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාර්ය තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායිතාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම පැය 24 පුරාම ක්‍රියාත්මක වන ගාස්තු රහිත 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව හා පැමිණිලි මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබයි. 2023 වර්ෂයේදී 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව සඳහා පැමිණිලි 2,990ක් ලැබී ඇති අතර පැමිණිලි මධ්‍යස්ථානය සඳහා ඇති පැමිණිලි සංඛ්‍යාව 380කි.

## මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනයේ පවත්නා සුවිශේෂී අවශ්‍යතාවයන් හා ගැටලු සැලකිල්ලට ගනිමින් ප්‍රථම වරට මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය ලෝක බැංකු ණය ආධාර මත 2016 දී ආරම්භ කර 2023 ජුනි දක්වා ක්‍රියාත්මක විය. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- හඳුනාගත් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 6,637 ක් වෙත ජල පෙරණ උපකරණ, ක්‍රීඩා උපකරණ, ලී බඩු උපකරණ ලබාදීම.
- ළමුන් 57,778ක් සඳහා උපකාරක පන්ති ගාස්තු ආධාර ලබාදීම
- අමාත්‍යාංශය, පළාත් සභා හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් සිදුකරන ලද දෙමව්පියන් දැනුවත් කිරීම වැඩසටහන් 4,045 ක් පැවැත්වීම.
- අමාත්‍යාංශයේ නායකත්වය හා සම්බන්ධීකරණය යටතේ සකසන ලද විෂයමාලා රාමුව හා මාර්ගෝපදේශ සකස් කිරීම.
- ඉගෙනීම් වැඩි දියුණු කර ගැනීම සඳහා ඍජු මැදිහත්වීම් මඟින් සිසුන් 181,305 සඳහා ප්‍රතිලාභ ලබා දීම.
- සමාජ විගණනය මඟින් ප්‍රතිලාභී ප්‍රතිපෝෂණ සමීක්ෂණය වාර්තාව ලෝක බැංකුව වෙත ලබාදී ඇත.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන දරුවන් 109,597 සඳහා උදෑසන ආහාර වේල ලබාදීම.

# සමාජ සවිබලගැන්වීම් අංශය

## සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශය (SDB)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

### 1. සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන සඳහා මෙම වසරේ අවසාන කාර්තුව තුළ ලද රු.මිලියන 150 ප්‍රතිපාදන භාවිතයෙන් පවතින ගම්මාන 50 ක හා නව ගම්මාන 16 ක ප්‍රතිලාභීන් 4,070 දෙනෙකුගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා තාක්ෂණික සහයන්, උපකරණ, ඉදිකිරීම්, ධීවර හා සත්ව පාලනයට අවශ්‍ය සහය ලබාදීමට මෙම කාර්යංශය කටයුතු කළ අතර මේ සඳහා රු.මිලියන102 ක මුදලක් වැය කරන ලදී.

**භාණ්ඩාගාර ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

නිෂ්පාදන ගම්මාන 79 ක ප්‍රතිලාභීන් 3,456 දෙනෙකු සඳහා සහයක ආයතනවල දායකත්වයද ලබා ගනිමින්, ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය, අලෙවි ප්‍රවර්ධනය හා ආකල්ප සංවර්ධනය සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කරවීමට හා වෙළඳපල අවස්ථා සොයාදීමට අවශ්‍ය මැදිහත් වීම් සිදුකරන ලදී.

### 2. ග්‍රාම ශක්ති වැඩසටහන

ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ අදියර දෙකක් ලෙස ප්‍රජා පාලිත ජනතා සමිති 3,618 ක් පිහිටුවා ඇති අතර එම සමිතිවල ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් සඳහා රු. මිලියන 1,641.68 ක මුදලක් සක්‍රිය සමිති 1,551 ක ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. මේ වනවිට එම සමිතිවලින් සක්‍රිය සමිති තවදුරටත් ශක්තිමත් කිරීමටත්, අක්‍රිය සමිති 2,067ක් සතුව පවතින රු. මිලියන 635.70ක මුදල් සක්‍රිය සමිතිවල ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් සඳහා යෙදවීමටද, ඉතිරි මුදල් ඵලදායි ලෙස භාවිතා කිරීමටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

## ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSPD)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 34ක් වෙන් වී ඇති අතර රු. මිලියන 34.23ක් වැය වී ඇත. වැඩිපුර වියදම් වී ඇති රු. මිලියන 0.23ක මුදල ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික අරමුදලෙන් ලබාගෙන ඇත. පුනරාවර්තන ප්‍රතිපාදන මිලියන 10,818.00ක් වෙන් වී ඇති අතර රු. මිලියන 8,520.30ක් වැය වී ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 1. ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා ආධාර ලබාදීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- **ආධාරක උපකරණ ලබාදීම** - රු. මිලියන 11.24 ක් වැය කොට ජංගම සේවා 13 පවත්වා ඇති අතර ඒ යටතේ මූල්‍ය අනුග්‍රහ 7, කිහිලිකරු 38, ඇවිදීමේ ආධාරක උපකරණ 24, රෝද පුටු 65, කෘත්‍රිම පාද 22, ශ්‍රවණ උපකරණ 8, ඇස් කණ්ණාඩි 7,425, දුර සහ ළඟ පෙනෙන කණ්ණාඩි 64, අක්ෂි කාච 1, විශේෂ පාවහන් 2, කොමඩ් සහිත රෝද පුටු 14, අත්වාරු 67 හා වායු මෙට්ට 1ක් ලබාදීම.
- **වෛද්‍ය ආධාර ලබාදීම** -ආබාධ සහිත පුද්ගලයන් 542 ක් සඳහා රු. මිලියන 9.73ක් වැය කිරීම

- **අධ්‍යාපන ආධාර ලබාදීම -**ආබාධ සහිත සිසුන් 461 ක් සඳහා රු. මිලියන 5.37 ක් වැය කිරීම.
- **නිවාස ආධාර ලබාදීම -** සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමින් 5% ක් නිවාස අරමුදල සඳහා ප්‍රතිපාදන ලැබෙන අතර රු. මිලියන 22.98 ක් වැය කොට ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ඒකක 241ක් සඳහා ප්‍රතිපාදන ලබාදීම.

## 2. ආබාධ සහිත තැනැත්තන්ගේ ආර්ථික සංවර්ධනය සඳහා ආධාර ලබාදීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- **ස්වයං රැකියා ආධාර ලබාදීම** - ආබාධ සහිත පුද්ගලයන් 154 ක් සඳහා රු. මිලියන 5.12 ක් වැය කිරීම.
- **කුසලතා සංවර්ධනය** - රු. මිලියන 0.22 ක් වැය කොට ආබාධ සහිත පුද්ගලයින් 5 ක් සඳහා මූල්‍යාධාර ලබාදීම.
- **පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම** - ආබාධ සහිත පුද්ගලයින් 31ක් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමුකර ඇති අතර මිලියන 0.63 ක් වැයකොට ඇති අතර පුද්ගලයන් 10 ක් සඳහා වැටුපෙන් 50% ක් ගෙවීම. ඒ යටතේ ආබාධිත පුද්ගලයන් 6 ක් Cargills ආයතනයේ හා 25 ක් Pizza Hut ආයතනයේ හි රැකියා සඳහා යොමු කිරීම.

## 3. ආබාධ සහිත තැනැත්තන් සඳහා මාසික ජීවනාධාරය ලබාදීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව සඳහා රු. මිලියන 5,609.28 ක් වැයකොට නිත්‍ය ප්‍රතිලාභීන් 72,000 ක් අමතර ගෙවීම් 17,882 ක් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් 16,139 ක් සඳහා එම දීමනාව ලබාදීම.
- වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව ලබාදීම සඳහා රු. මිලියන 2,901.39 ක් වැයකොට නිත්‍ය ප්‍රතිලාභීන් 39,150 ක් අමතර ගෙවීම් 18,159 ක් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් 1,924 ක් සඳහා එම දීමනාව ලබාදීම.

## 4. ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ආහාර සුරක්ෂිතතාවය සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය

- අකුරුස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය සඳහා රු. මිලියන 7.75ක් වැයකර ලී බඩු මිලදී ගැනීම.
- ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීමේ පුහුණු වැඩසටහන් 10ක් පැවැත්වීම (ප්‍රතිලාභීන් 300) සඳහා රුපියල් මිලියන 0.86ක් වැය කිරීම.
- ආබාධ සහිත තැනැත්තන් 08 දෙනෙකු සඳහා තම ස්වයං රැකියාව වැඩි දියුණු කර ගැනීම වෙනුවෙන් රු. මිලියන 0.4ක් ආධාර ලෙස ලබා දීම.
- ආබාධ සහිත පුද්ගලයින් රැකබලා ගැනීම හා සමාජගත කිරීම පිළිබඳ ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන් 4ක් පැවැත්වීම සඳහා මිලියන 0.56ක් වැයකිරීම.

## 5. වෙනත් සංවර්ධන වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- රු. මිලියන 9 ක් වැය කොට වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාම වෙනුවෙන් සේවකයින්ගේ වැටුප්, ජල හා විදුලි බිල්පත් ගෙවීම.
- ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව "ආබාධිත පුද්ගලයින් සඳහා ඔවුන් සමඟ සහ ඔවුන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාකාරීව එක්සත් වේ" තේමාව යටතේ සාකච්ඡාමය වැඩසටහනක් හා ප්‍රවේශ වියහැකි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ

වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. මෙම වැඩසටහන සඳහා රු.මිලියන 1.14 ක පෞද්ගලික අංශයේ ආධාර හා පරිත්‍යාග යොදාගත් අතර රු. මිලියන 0.47ක් පමණක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ලබාගන්නා ලදී.

**භාණ්ඩාගාර ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- UN Habitat ආයතනය සමග එක්වී ආබාධ සහිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදු කිරීම
- ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීම.

## වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික මහලේකම් කාර්යාලය (NSE)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 5ක් වෙන්වී ඇති අතර රු. මිලියන 2.90ක් වැය වී ඇත. පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස මිලියන 143.78ක් වෙන් වී ඇති අතර (අංක. 01/2023 හා 2023.01.27 දිනැති වියදම් කළමණාකරන චක්‍රලේඛය අනුව අනුමත පුනරාවර්තන ප්‍රතිපාදනවලින් 6% අඩු කර ඇත.) රු. මිලියන 137.97ක් වැයවී ඇත. වැඩිහිටි දීමනා ගෙවීම් සඳහා රු. මිලියන 24,430.69 ක් වෙන්වී ඇති අතර රු. මිලියන 22,533.57 ක් වැය වී ඇත.
වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 643.26 ක් වැය වී ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 1. වැඩිහිටි තැනැත්තන් සඳහා මාසික ජීවනාධාරය ලබාදීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටි දීමනාව ලබාදීම යටතේ නිත්‍ය ප්‍රතිලාභීන් 416,667ක් සඳහා රු. 2,000/- බැගින්ද, අමතර දීමනා 235,315ක් සඳහා රු. 3,000/- බැගින්ද, පොරොත්තු ලේඛනයේ සිටින 109,583 දෙනෙකු සඳහා රු.5,000/- ගෙවීම් සිදුකිරීම සඳහා රු. මිලියන 22,401.96 ක් වැය කිරීම
- රු. මිලියන 28.02 ක් වැය කර වයස අවුරුදු 100ට වැඩි වැඩිහිටි දීමනාව යටතේ නිත්‍ය ප්‍රතිලාභීන් 387 ක් සහ අමතර දීමනා ප්‍රතිලාභින් 177 දෙනෙකු සඳහා ගෙවීම් සිදු කිරීම.

### 2. වැඩිහිටි තැනැත්තන් සඳහා ආධාර ලබාදීම

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- **වෛද්‍ය ආධාර ලබාදීම** - කිසිදු දීමනාවකට හිමිකම් නොකියන, නිදන්ගත බෝ නොවන රෝග වලින් පෙළෙන වැඩිහිටියන් සඳහා රුපියල් 25,000 බැගින් ලබාදෙන "ආරෝග්‍යා" වෛද්‍ය ආධාර වැඩසටහන යටතේ වැඩිහිටියන් 1,627 සඳහා රු.මිලියන 41.18 ක් ලබාදීම.
- **ශ්‍රවණාධාර ලබාදීම** - රු.මිලියන 50.68ක් වැයකර අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 1,500 ක් සඳහා ශ්‍රවණාධාර ලබාදීම.
- **අක්ෂිකාච ලබාදීම** -රු.මිලියන 7.57 ක් වැයකර අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 1,000 ක් සඳහා අක්ෂි කාච ලබාදීම.
- **ඇස් කණ්නාඩි ලබාදීම** -අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 2,054 ක් සඳහා ඇස් කණ්නාඩි ලබා දීම සඳහා රු. මිලියන 10.20 ක් වැය කිරීම.

- **ස්වයං රැකියා ආධාර ලබාදීම** - එක් වැඩිහිටියෙක් සඳහා රු. මිලියන 0.05 බැගින් වැඩිහිටි පුද්ගලයින් 525ක් සඳහා ආධාර සැපයීම.
- **වෛද්‍ය පහසුකම් සැපයීම** - සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම හරහා රු. මිලියන 4.22 ක් වැයකර වැඩිහිටියන් 2,886 ක් සඳහා පහසුකම් සැපයීම.

## 3. වැඩිහිටි තැනැත්තන් සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැපයීම

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- වැඩිහිටියන්ට තමන්ගේම නිවෙස්වල ජීවත් වීමට අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා එක් ප්‍රතිලාභියෙකුට රු. මිලියන 0.1 ක් ලබාදීමේ "සුව පහසු" මූල්‍යාධාර ක්‍රමය යටතේ වැඩිහිටියන් 2,252 ක් සඳහා රු. මිලියන 119.83 ක් ලබාදීම.
- "දිරිය පියස" නිවාස වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහිත නිවාස 49ක් ඉදි කිරීම/අළුත්වැඩියා කිරීම වෙනුවෙන් එක් නිවසක් සඳහා රු. මිලියන 0.7 ලබාදීම සඳහා මිලියන 34.95 ක් ලබාදීම.

## 4. වැඩිහිටි කමිටු බලගැන්වීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා රු. මිලියන 0.39 ක් වැය කිරීම.

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ග්‍රාමීය මට්ටමේ වැඩිහිටි කමිටු 625ක් බලගැන්වීම සඳහා රු.මිලියන 62.42 ක් වැය කිරීම.
- රු. මිලියන 0.45ක් වැය කර ජාතික මට්ටමේ වැඩිහිටි සංවිධානයක් පිහිටුවීම.

## 5. වැඩිහිටි නිවාස සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීම, නඩත්තුව හා පවත්වාගෙන යාම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- රු. මිලියන 1.79ක් වැයකර මාලිගාතැන්න වැඩිහිටි නිවාසයන් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම.

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- පන්නල "WelcomeVillage" වැඩිහිටි නිවාසයේ නඩත්තුව සහ පරිපාලනය සඳහා රු.මිලියන 24.11ක් වැය කිරීම.
- දෙහිඅත්තකණ්ඩිය සරණ වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු සඳහා රු. මිලියන 0.24ක වියදමක් දැරීම.
- කතරගම වැඩිහිටි නිවාසයේ පරිපාලන කටයුතු සඳහා රු.මිලියන 1.08 ක් වැය කිරීම.
- කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීමේ කටයුතු සඳහා රු.මිලියන 92.94 ක් වැය කර ඇති අතර 51% ක භෞතික ප්‍රගතියක් අත් කරගෙන ඇත.
- රු. මිලියන 80.25 ක් වැය කර වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන 41 ක් ඉදිකිරීම.
- වැඩිහිටි නිවාස 22ක් ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා උපකරණ ලබාගැනීම සඳහා රු. මිලියන 33.50ක් ලබාදීම.
- වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 15ක් සඳහා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 8.08 ක වියදමක් දැරීම.

## 6. දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- විශ්‍රාම දිවිය පිළිබඳව පාසල් සිසුන් සහ විශ්‍රාම යාමට ආසන්න පුද්ගලයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 37 ක් පැවැත්වීම වෙනුවෙන් රු. මිලියන 2.64ක් වැය කිරීම.

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි වැඩිහිටි නිවාසවල සේවය කරන පාලිකාවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ පාලිකාවන් 224ක් පුහුණු කිරීම සඳහා රු. මිලියන 2.34 ක් වැය කිරීම.
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ඩිජිටල් සාක්ෂරතා සහ වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා යෝග අභිප්‍රේරණ වැඩසටහන් 45 ක් පැවැත්වීම සඳහා රු. මිලියන 6.29 ක වියදමක් දැරීම.
- වැඩිහිටියන් සඳහා යෝග ව්‍යායාම සහ සරල ව්‍යායාම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 2ක් පැවැත්වීම සඳහා රු. මිලියන 2.90 ක් වැය කිරීම.
- ග්‍රාමීය වැඩිහිටි කමිටු භාණ්ඩාගාරිකවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩමුළු 161 ක් පැවැත්වීම සඳහා රු. මිලියන 4.61 ක් වැය කිරීම.
- රු. මිලියන 0.07ක් වැයකර වියපත්වීම පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හරහා පුද්ගලයින් 50ක් පුහුණු කිරීම.

## 7. වෙනත් වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- රු. මිලියන 0.91 ක් වැයකර වැඩිහිටි හැඳුනුම්පත් 64,024ක් නිකුත්කිරීම.
- වැඩිහිටි නඩත්තු මණ්ඩලයෙහි පැමිණිලි 145 ක් විසඳීම සඳහා රු. මිලියන 1.72 ක් වැය කිරීම.
- රු. මිලියන 0.24 ක් වැයකර ක්ෂේත්‍ර පරීක්ෂා 7 ක් සිදුකිරීම.
- වැඩිහිටියන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් 7ක් පැවැත්වීම.
- රු. මිලියන 2.25 ක් වැයකර ජාතික වැඩිහිටි සභා රැස්වීම් 11ක්, කළමනාකරණ හා විගණන රැස්වීම් 4 ක්, ප්‍රගති සමාලෝචන සාකච්ඡා 6ක් පැවැත්වීම.
- වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම හා භාෂා පරිවර්තනය සඳහා රු. මිලියන 0.14ක් වැය කිරීම.

**වැඩිහිටි ආරක්ෂණ අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- වැඩිහිටියන්ගේ ආගමික චාරිකා සඳහා මූල්‍ය පහසුකම් සැපයීම යටතේ එක් චාරිකාවක් සඳහා රු. මිලියන 0.075ක් ලබාදීමේ වැඩසටහන යටතේ චාරිකා 360ක් සඳහා රු. මිලයන 27.02 ක් ලබා දීම.
- රු. මිලියන 1.13 ක් වැයකර දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 60ක් පැවැත්වීම.
- ආර්ථික උත්පාදන වැඩසටහන් 3 පැවැත්වීම වෙනුවෙන් රු. මිලියන 0.60ක් වැයකිරීම.

# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

## ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු.මිලියන 5.30 ක් වෙන් වූ අතර ඉන් රු.මිලියන 1.25 ක් වර්ෂය තුළ වැය වී ඉතිරි රු.මිලියන 4.05 සඳහා බැඳීම් ඇතිකරගෙන ඇත. පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස අනුමත වූ රු.මිලියන 150ක මුදලින් අංක 01/2023 හා 2023.01.27 දිනැති වියදම් කළමනාකරණ චක්‍රලේඛය අනුව රු.මිලියන 4.2ක් ඉතිරි කරන ලද අතර රු.මිලියන 145.8 ක් පුනරාවර්තන වියදම් සඳහා නිදහස් කරන ලදී. එයින් රු. මිලියන 135.6ක් වර්ෂය තුළ වැය වී ඇති අතර ඉතිරිය සඳහා බැඳීම් ඇතිකරගෙන ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## 1. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා සාමාජිකයින් බඳවා ගැනීම සහ ප්‍රතිලාභ ගෙවීම.

- විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා සාමාජිකයන් 66,448 ක් බඳවාගෙන ඇති අතර එහි පළමු වාරික මුදල ලෙස රු. මිලියන 145.25ක් අයකර ගෙන ඇත.
- සාමාජිකයින් 35,191 ක් සඳහා මාසික විශ්‍රාම වැටුප් ලබාදීම සිදුකර ඇති අතර ඒ සඳහා වර්ෂය තුළ රු. මිලියන 407.00ක් වැය කර ඇත.
- සාමාජිකයින් 48 දෙනෙකු සඳහා රු. මිලියන 2.40 ක් මරණ පාරිතෝෂික ලෙස ගෙවීම් කර ඇත.
- අර්ධ අබාධිත පාරිතෝෂික සහ පූර්ණ ආබාධිත මාසික දීමනා ලෙස රු. මිලියන 0.65ක ගෙවීම් සිදුකර ඇත.
- සාමාජිකයින් 581 ක් සඳහා අතිරේක ප්‍රතිලාභ (5 වසර ශිෂ්‍යත්ව, අ.පො.ස (සා/පෙළ), අ.පො.ස. (උ/පෙළ) ලෙස රු. මිලියන 7.43ක ගෙවීම් සිදුකර ඇත.

## 2. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම ප්‍රවර්ධනය කිරීම.

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- සමාජ ආරක්ෂණය සම්බන්ධ දැනුම ප්‍රචලිත කිරීමට, ඒ පිළිබඳ විෂය කරුණු පාසල් විෂයට ඇතුළත් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව කටයුතු කරන ලදී. 2023 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද නව පාසල් විෂය නිර්දේශයට සමාජ ආරක්ෂණය පිළිබඳ විෂය කරුණු ඇතුළත් කර ඇත. ඒ අනුව 9 වන ශ්‍රේණිය සඳහා සකස් කරන ලද "පුරවැසි අධ්‍යාපන විෂය නිර්දේශ රාමුව" තුළ "නීතිය සහ සමාජ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තු පනත් මගින් ස්ථාපිත කරන ලද ආයතන" යටතේ සමාජ ආරක්ෂණ පරිච්ඡේදය ඇතුළත් කර ඇත.

- සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුම හා අවශ්‍යතාව ප්‍රචලිත කිරීම, සම්පත් කළමනාකරණය, ව්‍යවසායකත්වය, යැපුම් මානසිකත්වයෙන් මිදීම, නිසි වෘත්තීය ගරුත්වය ලබාදීම වැනි තත්ත්වයන් පිළිබඳව පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා දෙමාපියන් දැනුවත් කිරීමට දීප ව්‍යාප්ත වැඩසටහන් 124 ක් පවත්වන ලදී.

**විශ්‍රාම වැටුප් අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- අක්‍රීය සාමාජිකයන් 1,032ක් නැවත සක්‍රිය කිරීමට කටයුතු කර ඇති අතර රු.මිලියන 7.64ක හිඟ වාරික නැවත අය කරගෙන ඇත. ඒ වෙනුවෙන් රු. මිලියන 0.271ක් වැයකර ඇත. එමෙන්ම සාමාජිකයන් 26,469ක් සක්‍රීයව පවත්වාගැනීම සඳහා ලිපි යොමුකරන ලදී.

- විවිධ වූ ක්ෂේත්‍රවල රැකියාවන් හා වෘත්තීන්වල නිරතවූවන්ට ඔවුන්ගේ රැකියාවන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ට නිසි සමාජ ආරක්ෂණය ලබාදීම සඳහා විශේෂ ප්‍රතිලාභ සහිත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදෙන ලදී. ඒ අනුව නාවික ක්ෂේත්‍රය සඳහා "නාවිකයා" සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය, විදේශ සේවා නියුක්තිකයින් සඳහා "මනුසවි" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ කලා ක්ෂේත්‍රය සඳහා "කලාකරු" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආදී යෝජනා ක්‍රමයන් ඔස්සේ පුද්ගලයින් 681 ක් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ඔප්පු පිරිනැමීම සිදුකර ඇත.

- සමාජ ආරක්ෂණය මණ්ඩලය සහ මණ්ඩලය විසින් හඳුන්වා දී ඇති විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සමාජ මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම, රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාරණ දැන්වීම් විකාශනය, පුවත්පත් ලිපි හා පුවත්පත් දැන්වීම් එලකිරීම සිදුකර ඇති අතර ඒ සඳහා රු.මිලියන 1.586ක් වැයකර ඇත.

### 3. ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් ඔවුන්ගේ අදාළ වෘත්තීන්වල යෙදෙන ලෙස දිරිමත් කිරීම, සකසුරුවම්වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම

**විශ්‍රාම වැටුප් අරමුදල මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

ස්වයංරැකියාවල යෙදෙන පුද්ගලයින් දිරිමත් කිරීම, ස්වයංරැකියා නියුක්තිකයින් සඳහා විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම සහ ඔවුන් වෙත සකසුරුවම් වීම හා සම්පත් කළමණාකරණය සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් 4,148 ක් පැවැත්වීම සිදු කළ අතර ඒ සඳහා රු. මිලියන 1.279ක් වැයකර ඇත.

## ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 5.30ක් වෙන් වී ඇති අතර වියදම රු. මිලියන 3.64කි. පුනරාවර්තන ප්‍රතිපාදන ලෙස මිලියන 130.31ක් වෙන් වී ඇති අතර (අංක. 01/2023 හා 2023.01.27 දිනැති වියදම් කළමණාකරන චක්‍රලේඛය අනුව අනුමත පුනරාවර්තන ප්‍රතිපාදන වලින් 6% අඩු කර ඇත.) රු. මිලියන 115.68ක් පුනරාවර්ථන වියදම් සඳහා නිදහස් කරන ලදී. සත්‍ය වියදම රු. මිලියන 114.02 කි.

ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදුව ප්‍රදේශයේ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු. මිලියන 230ක් වෙන් වී ඇති අතර රු. මිලියන 75.76ක් වැයකර ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### 1. ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදුව ප්‍රදේශයේ ඉදිකරනු ලබන ගොඩනැගිලි සංකීර්ණය

A හා B වශයෙන් කොටස් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම 2017.01.01 දින ආරම්භ කරන ලද අතර මෙම ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 1,000 ක් වන අතර 2017.01.01 සිට 2023.09.30 දක්වා රු.මිලියන 830.45ක මූල්‍යමය ප්‍රගතියක් අත්කරගෙන ඇත. 2023 වර්ෂය වෙනුවෙන් රු. මිලියන 190ක් වෙන් වී ඇති අතර 35.89ක් වියදම් කර ඇත. 2017.01.01 දින සිට 2023.12.31ක දක්වා රු. මිලියන 866.34ක් මූල්‍යමය ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු වලින් 98.16% අවසන් කර ඇත.

### 2. උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි සිසුන් 714 ක් අධ්‍යයන කටයුතු සිදුකරනු ලබයි. (වියදම - රු.මිලියන 4.02)
- සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හදාරණ සිසුන් 258ක් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම. (වියදම - රු. මිලියන 4.48)
- සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ (2017/2018) උපාධි ප්‍රධානෝත්සවය පැවැත්වීම.
- උපදේශන ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමේ අනුමැතිය ලබාගැනීම සඳහා අවශ්‍ය වන සංශෝධිත යෝජනාව නැවත ඉදිරිපත් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතී.
- භාෂා සහ සංස්කෘතික අධ්‍යයන පාසල පිහිටුවීමට සමගාමීව තරුණයින් සඳහා ඉංග්‍රීසි භාෂාව පුහුණු කිරීමට අදාළව විෂයමාලා සංවර්ධන කටයුතු අවසන් කිරීම. (වියදම - රු. මිලියන 0.21)

**මුදල් අය කරමින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- 2019/2020 අධ්‍යයන වර්ෂයේ (ඉංග්‍රීසි මාධ්‍ය) සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා සහභාගී වූ සිසුන් 08 සඳහා උපාධි ප්‍රදානෝත්සවය පවැත්වීමහා 2020/2021 අධ්‍යයන වර්ෂය හා 2021/2022 අධ්‍යයන වර්ෂයන්ට අදාලව සිසුන් 140ක් අධ්‍යයන කටයුතු සිදුකිරීම. මෙම පාඨමාලාව පැවැත්වීම වෙනුවෙන් රු. මිලියන 15.35ක් අයකරගෙන ඇති අතර රු. මිලියන 11.30ක් වැයවී ඇත.
- අධ්‍යයන වර්ෂ 3කට (2021/2022, 2022/2023, 2023,2024) අදාළව උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම වෙනුවෙන් සිසුන් 623ක් සහභාගී වීම. මේ සඳහා අයකර ගෙන ඇති මුළු ආදායම රු. මිලියන 12.21ක් වන අතර මුළු වියදම රු. 9.18කි.
- සිසුන් 21ක් සඳහා මාස 18ක උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම වෙනුවෙන් 2023 වර්ෂය සඳහා රු. මිලියන 0.03ක ආදායමක් ලැබී ඇති අතර 2023 වර්ෂය තුළදී රු. මිලියන 0.86ක් වැයවී ඇත.
- සමාජ වැඩ/උපදේශනය/ළමා කේන්ද්‍රීය ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 500 සහභාගී වී ඇති අතර ප්‍රතිඵලය නිකුත් කිරීමට නියමිතය.

### 3. පුහුණු වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- අනෙකුත් දෙපාර්තමේන්තුවල ඉල්ලුම මත ක්‍රියාත්මක වන කෙටි කාලීන පුහුණු පාඨමාලා යටතේ වැඩසටහන් 20ක් පවත්වා ඇත. (වියදම - රු. මිලියන 0.10)
- නියෝජිතායතන ක්ෂේත්‍ර සහ පිය අධීක්ෂකවරුන් 130ක් පුහුණු කිරීම. (වියදම - රු. මිලියන 0.01)
- කාර්ය මණ්ඩල නිලධාරීන් 5ක් සඳහා ඉගැන්වීම පිළිබඳ පාඨමාලාවක් පැවැත්වීම. (වියදම - රු.මිලියන 0.25)
- අනුමත උසස් අධ්‍යාපනික සහ පුහුණු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම යටතේ කාර්ය මණ්ඩල නිලධාරීන් පුහුණු කිරීම (වියදම - රු.මිලියන 0.15)

### 4. පර්යේෂණ හා ප්‍රකාශන නිකුත් කිරීම

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- සමාජ වැඩ පිළිබඳ ජර්නලය, සමාජ සංවර්ධනය පිළිබඳ ජර්නලය, පුවත් ලිපි ඇතුළුව ප්‍රකාශන 9 ක් මාර්ගගතව නිකුත් කිරීම. (වියදම - රු.මිලියන 0.11)
- පොත් 9ක් එළිදැක්වීම සහ විද්වත් කතිකාව පැවැත්වීම.
- සමාජ සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයමාලා සංවර්ධන ඉල්ලුම පිළිබඳ සමීක්ෂණ සිදු කරමින් පවතී. (60%)
- ඒකාබද්ධ සමාජ වික්‍රියා ක්‍රියාකාරකම් හරහා විවිධත්වයට ගරු කිරීම පිළිබඳ සමාජ වැඩ පිළිබඳ අන්තර් ජාතික සමුළුව පැවැත්වීම
- සමාජ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනය III ප්‍රකාශයට පත්කිරීම.

## ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (RDTRI)

### ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 50ක් වෙන් වී ඇති අතර රු. මිලියන 38.45 ක් වැයවී ඇත. බොරැල්ල සහ පිළිමතලවේ මධ්‍යස්ථානයන්හි පිහිටි නේවාසිකාගාර හා දේශනශාලා බාහිර ආයතන වෙත ලබාදීම මඟින් රු.මිලියන 4.04ක ආදායමක් ලබා ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## 1. පර්යේෂණ, සමීක්ෂණ සහ අධ්‍යයන

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ප්‍රජාවගේ ආහාර අයිතීන් සුරක්ෂිත කිරීම සහ තෘප්තිය වැඩිකිරීම සඳහා පදික වෙළෙන්දන් පිළිබඳව කාර්බද්ධ පර්යේෂණයක් සිදුකිරීම. (බණ්ඩාරවෙල, පානදුර, හික්කඩුව, යාපනය, කඩුගන්නාව යන පළාත් පාලන බල ප්‍රදේශ ආවරණය වන පරිදි).
- සමෘද්ධි වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යවසාය සංවර්ධන වැඩසටහන හරහා ප්‍රතිලාභී පවුල්වල ආර්ථික තත්ත්වයට වන බලපෑම පිළිබඳ සමීක්ෂණය සිදු කිරීම. මහනුවර, කොළඹ, කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මත පදනම්ව මෙම සමීක්ෂණය සිදු කරන ලදී.
- සෞභාග්‍යා ගම්මානවල වත්මන් තත්ත්වය පිළිබඳ අධ්‍යයනය නිමකර ඇති අතර එයට අදාළ වාර්තා 20ක් අමාත්‍යාංශයට ලබාදීම.
- මහනුවර දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු වැඩසටහන මඟින් පවත්වන ලද කාන්තා ආර්ථික තත්ත්වය සංවර්ධනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල කාර්යභාරය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන වාර්තා සකස් කිරීම

(ඉහත වැඩසටහන් සඳහා රු. මිලියන 0.23ක් වැයවී ඇත.)

**භාණ්ඩාගාර ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ශ්‍රී ලංකාවේ යාචකයින් පිළිබඳ සමීක්ෂණය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ දත්ත රැස් කිරීම.

## 2. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් මැදිහත්කරුවන් ලෙස ගොඩනැඟීම සඳහා පුහුණු හා මැදිහත්වීම්වලට අදාළ පුහුණු වැඩසටහන් 11ක් පැවැත්වීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල ව්‍යවසාය සංවර්ධන පුහුණු මැදිහත්වීම් සහ ගෘහ කළමණාකරණය පිළිබඳව ප්‍රවර්ධන වැඩසටහන් 2ක් පැවැත්වීම.
- ආයතනයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 12ක් පැවැත්වීම.

(ඉහත වැඩසටහන් සඳහා රු. මිලියන 0.09ක් වැයවී ඇත.)

**භාණ්ඩාගාර ප්‍රතිපාදන රහිතව ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- කිතුල් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ එක්දින වැඩසටහනක් පැවැත්වීම - සහභාගීත්වය 56
- සෞභාග්‍යා එළදායි ගම්මානයන්හි ඉදිරි වැඩ සැලැස්ම සකස් කිරීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනුවත් කිරීමේ වැඩසයහනක් පැවැත්වීම - සහභාගීත්වය 30
- ග්‍රාම සංවර්ධන සමිතියේ නිලධාරීන් ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක්දින පුහුණු වැඩසටහනක් පැවැත්වීම - සහභාගිත්වය 38
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම - සිසුන් 57
- කාන්තා සහ ළමා හිතකාමී ඒකාබද්ධ ආදර්ශ ගම්මාන වැඩසටහන පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම - නිලධාරීන් 61
- කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා සහභාගීත්ව සංවර්ධන ක්‍රමය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම - සිසුන් 45
- සණස සිසුන් සඳහා සහභාගීත්ව සංවර්ධන ක්‍රමය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම - සිසුන් 51

## 3. ප්‍රකාශන

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ප්‍රජාශක්ති විද්‍යුත් සඟරාවෙහි පළමුභා දෙවන වෙළුම් වෙබ් අඩවියට මුදා හැරීම.
- ආයතනයෙහි සංවර්ධන පුවත් විද්‍යුත් මාධ්‍ය වෙත බෙදාහැරීම
- පුස්තකාලය සංවර්ධනය කිරීම යටතේ (SCAN) කරන ලද ලිපි 04ක් හා වාර්තා 1ක් වෙබ් අඩවියට මුදා හැරීම.
- ආයතනයේ පහසුකම් පිළිබඳව සකස් කරන ලද අත් පත්‍රිකා 03ක් අන්තර්ජාලයට මුදා හැරීම.

## 4. ක්‍රියාත්මකකරන ලද වෙනත් වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ආයතනයේ සංවර්ධන කටයුතුවලට අදාළ ප්‍රගති සමාලෝචන රැස්වීම් 12ක් පැවැත්වීම.

# උපදේශන අංශය

## ප්‍රගතිය හා විශේෂ ජයග්‍රහණ

2023 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 10ක් වෙන් වී ඇති අතර රු. මිලියන 0.72 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## 1. ප්‍රජාව වෙනුවෙන් සිදුකරනු ලබන උපදේශන වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් 23ක් දිස්ත්‍රික්ක 23ක් තුළ ක්‍රියාත්මක කිරීම.
- ගැහැණු ළමයින් සහ කාන්තාවන් සවිබලගැන්වීම සඳහා මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහන් 802 ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් 41,210 ක් මේ සඳහා සහභාගී වීම.
- මානසික ආබාධ හා ගැටළුකාරී තත්ත්වයන් සහිතව පැමිණි සේවාලාභීන් සඳහා තනිපුද්ගල උපදේශන සේවා සැසි 21,681ක් පැවැත්වීම.
- මානසික රෝග, මානසික ගැටළුකාරී තත්ත්වයන් හා විවිධ මනෝ සමාජයීය ගැටළු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිලාභීන් 343,416ක් සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් 8,225ක් පැවැත්වීම.
- ජංගම දුරකථන උපදේශන සේවය හරහා සේවාලාභීන්ගේ දුරකථන ඇමතුම් 3,869ක් සඳහා සේවය සැපයීම.

**වෙනත් අරමුදල් මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් (අධීක්ෂණ මට්ටම) සඳහා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 24 ක් පැවැත්වීම.
- කන්දකාඩු, සේනපුර, වවුනියා මධ්‍යස්ථානවල අන්තරායකර ඖෂධවලට ඇබ්බැහිවූවන් සහ නොමඟ ගිය සටන්කරුවන් පුනරුත්ථාපනය සඳහා කණ්ඩායම් උපදේශන වැඩසටහන් 358ක් (ප්‍රතිලාභීන් 1,874), යෝගා වැඩසටහන් 07ක් (ප්‍රතිලාභීන් 427), ගී රසවින්දන වැඩසටහන් 01ක් (ප්‍රතිලාභීන් 200) පැවැත්වීම.
- උපදේශන සේවා අවශ්‍යතා ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට උපදේශන නිලධාරීන්ගේ සේවය ලබාදීම. (රෝහල්, බන්ධනාගාර, ළමා හා වැඩිහිටි නිවාස, ගුවන්සේවා සමාගම).

## 2. පුහුණු වැඩසටහන්

**වෙනත් අරමුදල් මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- ආසියානු පදනම මඟින් ලබාගත් අරමුදල් භාවිතයෙන් උපදේශන නිලධාරීන් සඳහා කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම.

## 3. වෙනත් වැඩසටහන්

**භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

- නව මෘදුකාංග සහ උපකරණ භාවිතා කරමින් මනෝ විද්‍යාත්මක උපදේශන සේවාව සම්බන්ධීකරණය කිරීම, ප්‍රවර්ධනය සඳහා ආකෘති 3,200 මුද්‍රණය කිරීම. ආසියානු පදනම විසින් එම ආයතනයේ ප්‍රතිපාදන වැයකොට සේවාලාභී දත්ත පත්‍රිකා 212,500ක් මුද්‍රණය කර ලබාදී ඇත.
- උපදේශන අංශයේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම.
- අන්තර්ජාල පහසුකම් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර මානසික සෞඛ්‍ය සතියට සමගාමීව අමාත්‍යාංශ මට්ටමින් එක් වැඩසටහනක් පැවැත්වීම, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් රාජ්‍ය නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පැවැත්වීම.

# 2.3 අභියෝග

## කාන්තා හා ළමා කටයුතු අංශය

- කාන්තාවන්ගේ සාමූහික සංවිධාන ප්‍රයත්නයන්ට සහාය නොදක්වන සාම්ප්‍රදායික සමාජ ව්‍යුහයන්ගේ ප්‍රතිරෝධය.
- දුරස්ථ හෝ ආන්තික ප්‍රජාවන් තුළ කාන්තාවන් වෙත ළඟාවීමේ දුෂ්කරතාවය.
- සුළුතර ජනවාර්ගික, ග්‍රාමීය ප්‍රදේශ සහ ආබාධ සහිත අය ඇතුළු විවිධ කාන්තා කණ්ඩායම් ජාලය තුළ ඇතුළත් කර ගැනීම සහ නියෝජනය සහතික කිරීම.
- ආර්ථික සහ සමාජ සවිබලගැන්වීම සඳහා වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.
- විස්තීරණ සවිබලගැන්වීමේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සහ සම්පත් සීමිත වීම.
- ග්‍රාමීය කාන්තාවන්, තනිකඩ මව්වරුන් සහ ගැටුම්වලින් පීඩාවට පත් ප්‍රදේශවලින් පැමිණෙන කාන්තාවන් වැනි විවිධ කාන්තා කණ්ඩායම්වල විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් සැකසීමේ දුෂ්කරතාව.
- කෙටි කාලීන මැදිහත්වීම්වලින් ඔබ්බට වැඩසටහන්වල තිරසාර බව සහතික කිරීම.
- දත්ත රැස්කිරීමේ සහ විශ්ලේෂණයේ සීමිත ධාරිතාව සහ විශේෂඥතාව හේතුවෙන් වැඩසටහන්වල බලපෑම ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ ඇගයීම.
- ගැඹුරින් මුල් බැසගත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සම්මතයන් සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම සහ ප්‍රචණ්ඩත්වය පවත්වාගෙන යන සංස්කෘතික භාවිතයන්.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ලිංගික හිංසනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම් වැනි සමාජ දුෂ්කරතාවලට මුහුණදෙන කාන්තාවන් සඳහා නීතිමය පිළිසරණ සහ උපකාර සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම.
- පීතෘ මූලික ආකල්ප වලට අභියෝග කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් මුලපිරීම්වලට සමාජයේ ගතානුගතික කොටස්වල ප්‍රතිරෝධය.

- නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ ප්‍රජා නායකයින් ඇතුළු ප්‍රධාන පාර්ශවකරුවන් අතර කාන්තා අයිතිවාසිකම් පිළිබඳ සීමිත දැනුවත්භාවය සහ අවබෝධය.
- සමාජයේ විශේෂ හේතු නිසා විවිධ දුෂ්කරතාවලට මුහුණදෙන කාන්තාවන් සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හඳුනාගත් අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ප්‍රතිපාදන සීමාවන් හා අක් මුදල් ලැබීමේ ප්‍රමාදයන් හා සීමාවන්.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට අනුයුක්තව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය කරනු ලබන මුල් ළමාවිය සවර්ධන නිලධාරීන්ගේ ක්ෂේත්‍රගත සහ කාර්යාලගත රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්වී නොමැති වීම හේතුවෙන් නිලධාරීන්ගේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදුකළ නොහැකි වීම සහ වවුචර් පත්‍ර, කුවිතාන්සි පොත් සහ ආයතනය සතු වෙනත් ප්‍රකාශන ක්ෂේත්‍රය වෙත යොමු කිරීමට ඇති නොහැකියාව.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක ප්‍රධාන පුනරාවර්තන වැඩසටහන්වලට අමතරව ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් සඳහා මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයට වෙන්වූ වෙනම වැය ශීර්ෂයක් නොතිබීම හේතුවෙන් වෙනත් මූල්‍ය ආයතනවලින් ප්‍රතිපාදන මුදල් ලබාගැනීමට සිදුවීම. 2021ට පෙර ඒ සඳහා වැය ශීර්ෂයක් තිබී ඇත. (උදා - ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ජාතික සතිය ක්‍රියාත්මක කිරීම, ජාතික කමිටුව ක්‍රියාත්මක කිරීම.)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් විසින් දත්ත පද්ධති පවත්වා ගැනීම, ඒවා යාවත්කාලීන කිරීම, ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්හි ප්‍රගතිය සහ වෙනත් වාර්තාවන් සකස් කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ පරිගණක පහසුකම් සහ අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවීම හා ඇතැම් කාර්යාල තුළ කාන්තා, ළමා ඒකකය සඳහාම එක් පරිගණකයක් පමණක් තිබීම හේතුවෙන් නියමිත දිනට ප්‍රගතිය හා දත්ත ලබාදීම දැඩි අභියෝගයක් බවට පත්වීම.
- Lanka Women e- Market සඳහා සම්බන්ධවන කාන්තා ව්‍යවසායිකාවන්ට එමඟින් නිසි ප්‍රතිඵල ලබාගැනීම සඳහා තොරතුරු තාක්ෂණික දැනුම ප්‍රායෝගික භාවිතයේදී ගැටළු පැවතීම.
- කළමනාකරණ තොරතුරු දත්ත පද්ධති භාවිතය මෙන්ම, AI තාක්ෂණ භාවිතයද අවම තත්ත්වයක පැවතීම.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- අවශ්‍ය තාක්ෂණික විෂය දැනුම සහිත, දක්ෂතා සහ නිපුණතාවයන්ගෙන් පිරි නිලධාරීන්ගේ හිඟය හා සිටින නිලධාරීන් සතු කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ලබාදීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.

## සමාජ සවිබලගැන්වීම් අංශය

- සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අමුද්‍රව්‍ය මිල ඉහළ යාම, වෙළඳපොල ගැටළු, වෙන්වන ප්‍රතිපාදන සීමා සහිත වීම, නූතන තාක්ෂණය භාවිතය සඳහා මතුවන දුෂ්තරතා පැවතීම.
- ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය මට්ටමින් නිලාධාරී නොමැති අතර සමාජ සේවා නිලධාරීන් මඟින් රාජකාරී ඉටු කරගැනීමට යාමේදී සෘජුව විධාන දීමේ ගැටළුකාරී තත්ත්වයක් පවතී .
- අමාත්‍යාංශයට අදාළ සියළු නිලධාරීන් සඳහා අන්තර්ජාල හා පරිගණක පහසුකම් අවමවීම නිසා ප්‍රාදේශීය මට්ටමින් දත්ත ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදුවීම.
- අමාත්‍යාංශයේ ඇතැම් ආයතනවල පවතින නිලධාරී හිඟය.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහණ වර්ධනයට සාපේක්ෂව වැඩිහිටි දීමනාව ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- වැඩිහිටියන් නිවාසගතවීමේ ප්‍රවණතාවය වර්ධනය වීම හේතුවෙන් ඊට සාපේක්ෂව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ දුෂ්කරතා.
- ඇතැම් ප්‍රදේශීය ලේකම් කාර්යාලයන්හි පවතින ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය විශාල බැවින් විෂයය ආවරණය කිරීම සඳහා අනුමත ක්ෂේත්‍ර නිලධාරීන් ප්‍රමාණවත් නොවීම.
- ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා සීදූව ප්‍රදේශයේ ඉදිවන ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් වැඩි සිසුන් ප්‍රමාණයක් සඳහා පාඨමාලා පැවැත්වීමේ ඉඩ පහසුකම් සීමාවීම.
- ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීමේ ඉඩකඩ සීමාවීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන අංශයට අදාළ රාජකාරී කාර්යක්ෂම කිරීමේ ගැටලු මතුවීම.
- ආර්ථික අර්බුදය හමුවේ ඉලක්කගත පාරිභෝගිකයින්ගේ ආදායම් කෙරෙහි ඇති වූ අයහපත් බලපෑම මත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වෙත සාමාජික බඳවා ගැනීම හා වාරික රැස්කිරීම් දුෂ්කර වීම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රවර්ධනය කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් නොවීම සහ රාජ්‍ය චක්‍රලේඛ මඟින් වියදම් සීමාවන් පැනවීම.
- දායකයන්ගේ වාරික මුදල් සාපේක්ෂව ඉහළ අගයක පැවතීම හේතුවෙන් ස්වයං රැකියා නියුක්තික අඩු අදායම්ලාභීන් ඒ සඳහා රාජ්‍ය මූල්‍ය දායකත්වය අපේක්ෂා කිරීම.

## 2.4 ඉදිරි ඉලක්ක

### කාන්තා හා ළමා කටයුතු අංශය

- විවිධ වයස් කාණ්ඩවල කාන්තාවන් මුහුණදෙන සුවිශේෂී අභියෝග අවබෝධ කරගැනීම සඳහා පුළුල් පර්යේෂණ සහ සමීක්ෂණ පැවැත්වීම.
- නව යොවුන්වියේ පසුවන්නන්, වැඩකරන වෘත්තිකයන් සහ වයෝවෘද්ධ කාන්තාවන් ඇතුළු විවිධ ජීවන අවධිවල සිටින කාන්තාවන්ගේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා ඉලක්කගත වැඩසටහන් සහ මුලපිරීම් සංවර්ධනය කිරීම.
- ඵලදායී වැඩසටහන් සැලසුම් කිරීම සඳහා දත්ත සහ තීක්ෂණ බුද්ධිය එක්රැස් කිරීමට රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය ආයතන සහ ප්‍රජා නායකයින් වැනි අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වෙනස්කොට සැලකීම සහ අසමානතාවය පවත්වාගෙන යන සමාජ සම්මතයන් සහ ආකල්පවලට අභියෝග කිරීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාර සහ වැඩමුළු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, හිරිහැර කිරීම් සහ රැකියා ස්ථානයේ වෙනස්කම් කිරීම වැනි සමාජ දුෂ්කරතා අත්විඳින කාන්තාවන්ට උපදේශනය සහ නීතිමය සහාය ඇතුළු ආධාරක සේවා සැපයීම.
- අවදානම් තත්ත්වයන් තුළ කාන්තාවන්ගේ ආරක්ෂාව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ හවුල්කාරීත්වයක් ඇතිකර ගැනීම.
- තනි මව්වරුන්, වැන්දඹුවන්, ආබාධ සහිත කාන්තාවන් සහ සුළුතර ප්‍රජාවන්ට අයත් කාන්තාවන්ගේ ආන්තික කණ්ඩායම් ඉලක්කකර විශේෂිත වැඩසටහන් සංවර්ධනය කිරීම.
- ආර්ථික වශයෙන් අවාසිසහගත කාන්තාවන් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා සවිබලගැන්වීම සඳහා වෘත්තීය පුහුණුව, ක්ෂුද්‍ර මූල්‍ය අවස්ථා සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කිරීම.

- දරිද්‍රතාවය, සෞඛ්‍ය ගැටලු හෝ වෙනත් සමාජ ආර්ථික සාධක හේතුවෙන් දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙන කාන්තාවන් සඳහා සෞඛ්‍ය සේවා සහ සමාජ සුබසාධන ප්‍රතිලාභ සඳහා ප්‍රවේශය ලබාදීම.
- ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම.
- සහභාගීත්ව අනුපාත, කුසලතා සංවර්ධන ප්‍රතිඵල සහ කාන්තා ප්‍රතිලාභීන්ගේ සමාජ-ආර්ථික දර්ශක ඇතුළු ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළිබඳ දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන ගෘහස්ථ හිංසන, රැකියා ස්ථානයේදී සිදුවන හිංසන, පොදු ප්‍රවාහනයේදී සිදුවන හිංසන හා සයිබර් අපරාධ ඇතුළු විවිධ හිංසන ක්‍රියා සඳහා මුහුණදෙන පුද්ගල ප්‍රමාණය අවම කිරීම.
- එවැනි අපරාධවලට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය මඟපෙන්වීම සිදුකිරීම හා අදාළ වන පරිදි සේවාවන් වෙත කාර්යක්ෂමව යොමු කිරීම.
- කාන්තාවන් දේශපාලනයට අවතීර්ණ වීම වර්ධනය කිරීම.
- කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසන ක්‍රියා අවම කිරීම සහ හිංසනයන්ට එරෙහිව නැගී සිටීමට ජනතාව බලගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතා පනත හා කාන්තාවන් සවිබලගැන්වීමේ පනත හඳුන්වා දීම සඳහා කටයුතු කිරීම.
- "ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුව ළමුන් සඳහා එක් නීතියක් සකස් කිරීම" පනත හඳුන්වා දීම සඳහා කටයුතු කිරීම.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හා ලිංගිකත්වය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කිරීම .
- තාවකාලික කාන්තා රැකවරණ නිවාස පවත්වාගෙනයාම පිළිබඳ මාර්ගෝපදේශය එළිදැක්වීම.
- කාන්තාව සාමය හා ආරක්ෂාව පදනම් කරගත් පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම හා එක් එක් අමාත්‍යාංශයේ/ ආයතනයේ ප්‍රගතිය පසුවිපරම් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සහ කාන්තාවන් සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ළමුන්ට එරෙහි සයිබර් ප්‍රචණ්ඩත්වය (Cyber Violence) වැළැක්වීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- මිනිස් ජාවාරම පිටුදැකීම හා මෙහෙයවීම පිළිබඳ ජාතික උපායමාර්ගික සැලැස්මේ මෙම අමාත්‍යාංශයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල මඟින් වාර්ෂිකව ලබාදෙන මුදල් ප්‍රතිපාදන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම වෙනුවෙන් සාර්ථකව යෙදවීම.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක ප්‍රධාන සුභසාධන වැඩසටහන්වලට අදාළව ක්‍රමවත් දත්ත පද්ධතියක් සකස් කිරීම සහ එය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- නිවස පදනම් කරගත් වැඩසටහන් වඩා පුළුල්ව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම. මේ යටතේ අමාත්‍යාංශය විසින් ළමුන් පිළිබඳ කටයුතු කරන වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීමට අපේක්ෂිතය.
- මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත අනුයුක්තව සේවය කරනු ලබන නවක මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ සහ ප්‍රධාන කාර්යාලයේ නවක සංවර්ධන නිලධාරීන් සඳහා අවශ්‍ය ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ මුල් ළමාවිය සංවර්ධනය හා රැකවරණය සම්බන්ධව අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ පස් අවුරුදු බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම (2024-2028) සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සහ මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය

පිළිබඳ ජාතික කමිටු යාන්ත්‍රණය බලගැන්වීම තුළින් ඉහත සැලැස්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

## සමාජ සවිබලගැන්වීම් අංශය

- ශ්‍රී ලංකාවේ ජීවත්වන සියළුම පුරවැසියන්ගේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය.
- සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන හරහා දේශීය හා විදේශීය වෙළඳපොළ අවස්ථා පුළුල් කිරීම
- ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ පවතින සමිති සතු අරමුදල් සක්‍රිය සංසරණයට යෙදවීම.
- 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධනය අවසන් කිරීම.
- සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම
- ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම
- ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම
- දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම
- අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීම
- පොරොත්තු ලේඛනගත ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වැඩිහිටි දීමනාව ලබාදීම
- ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයක් (Internal Quality Assurance Unit) පිහිටුවා පවත්වාගෙන යාම.
- ජාතික සමාජ සංවර්ධන ආයතනයෙහි අධ්‍යයන කාර්යමණ්ඩලය විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයකට සමාන සුදුසුකම් ඇති කාර්යමණ්ඩලයක් වන අතර ඔවුන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා ආයතනය මඟින් පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබාදීම
- ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කටයුතු පුළුල් කිරීම සඳහා නව පාඨමාලා ආරම්භ කිරීමේ අවශ්‍යතාවය ඇති අතර දැනට පවතින අංශයන් (Divisions) අධ්‍යයන අංශ (Departments) ලෙස නම් කර ආයතනයෙහි ව්‍යුහාත්මක වෙනසක් ඇති කිරීම.
- ආයතනයේ අධ්‍යයන කටයුතු තවදුරටත් පුළුල් කරමින් උසස් පෙළ සමතුන් වැඩි පිරිසකට උසස් අධ්‍යාපනය ලබාදීමේ අරමුණින් ආයතනය විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීමට කටයුතු කිරීම.
- ආයතනයේ පස් අවුරුදු සැලැස්ම සකස් කිරීම (2023-2027) මඟින් ඉදිරි වර්ෂ සඳහා ආයතනයේ සංවර්ධන ක්‍රියාමාර්ග සැලසුම් කිරීම.
- විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම පුළුල් කිරීම හා ප්‍රතිලාභ පුළුල් කිරීම.
- ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයෙහි ලේඛන ඩිජිටල්කරණය කිරීම මඟින් සේවා කාර්යක්ෂම කිරීම
- නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවස්ථා පුළුල් කිරීම මඟින් සේවා ඵලදායිතාවය ඉහළ නැංවීම

.................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම:
තනතුර :
දිනය 2024/5/27

යමුනා පෙරේරා
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම්
අමාත්‍යාංශය
05 වන මහල, සෙත්සිරිපාය - අදියර II බත්තරමුල්ල.

# පරිච්ඡේදය 03

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | | | | | ඒසීඒ-එෆ් |
|---|---|---|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | | |
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය | | | | | |
| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තත්‍ය | | |
| | | | 2023 | 2022 | |
| රු. | | | රු. | රු. | |
| | | | | | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මතබදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හාවෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | | | | | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | **-** | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,715,719,945 | 1,814,521,001 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 48,060,337 | 27,157,529 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 53,929,653 | 202,172,895 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,817,709,935** | **2,043,851,425** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,817,709,935** | **2,043,851,425** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 77,271,596 | 11,560,292 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 1,740,438,339 | 2,032,291,133 | |
| | | | | | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | **-** | |
| **1,402,893,800** | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,309,970,267 | 1,143,556,592 | ඒසීඒ-2(ii) |
| **1,099,471,200** | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 896,644,376 | 835,124,775 | ඒසීඒ-2(ii) |
| **48,296,240,000** | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 38,345,089,100 | 12,705,436,785 | ඒසීඒ-2(ii) |
| **-** | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| **15,000** | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **50,798,620,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **40,551,703,743** | **14,684,118,152** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| **20,500,000** | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 12,614,544 | 10,020,708 | |
| **232,270,000** | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 77,786,440 | 80,243,535 | |
| **1,005,600,000** | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 247,071,290 | 85,204,725 | **ඒසීඒ-2(ii)** |
| **-** | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| **1,900,000** | හැකියා වර්ධනය | **14** | 701,777 | 1,272,519 | |
| **1,783,618,942** | වෙනත් මූලධන වියදම් | **15** | 1,667,520,350 | 3,784,955,608 | |
| **3,043,888,942** | **මුළු මූලධන වියදම් (උ)** | | **2,005,694,402** | **3,961,697,095** | |
| | | | | | |
| | තැන්පතු ගෙවීම් | | 65,735,567 | 15,938,013 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 62,833,895 | 359,021,480 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **128,569,462** | **374,959,493** | |
| | | | | | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 42,685,967,607 | 19,020,774,740 | |
| | | | | | |
| **-** | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(40,945,529,268)** | **(16,988,483,607)** | |
| | | | | | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (40,945,529,268) | (16,988,483,607) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | **ඒසීඒ-3** |
| | | | **(40,945,529,268)** | **(16,988,483,607)** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| | | | **ඒසීඒ-පී** |
| **2023 දෙසැම්බර් 31 දිනට** | | | |
| **මූල්‍ය තත්ත්වයපිළිබඳ ප්‍රකාශනය** | | | |
| | සටහන | තතය | |
| | | 2023 | 2022 |
| | | රු. | රු. |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | - |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,910,556,295 | 1,656,144,140 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 165,752,827 | 156,848,585 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **2,076,309,122** | **1,812,992,725** |
| | | | |
| **<u>ශුද්ධ වත්කම් /ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 111,223,654 | 84,644,181 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,910,556,295 | 1,656,144,140 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | - | - |
| | | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 54,529,173 | 72,204,404 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **2,076,309,122** | **1,812,992,725** |

පිටු අංක 51 සිට 53 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 60 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඒට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..................................
ප්‍රධාන ගණන් දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 2024/05/07

යමුනා පෙරේරා
ලේකම්
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම්
අමාත්‍යාංශය
05 වන මහල, සෙත්සිරිපාය - අදියර II බත්තරමුල්ල.

..................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි 2024.05.03.
නම :
තනතුර :
දිනය :

එල්.එම්. දෙනවක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම්
අමාත්‍යාංශය
01 වන මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල.

## 3.2 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | | |
| | සතය | |
| | 2023 | 2022 |
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 76,033,460 | 28,477,586 |
| අග්‍රිම ලැබීම් | 1,715,719,945 | 1,814,521,001 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 53,720,452 | 228,246,267 |
| තැන්පතු ලැබීම් | 48,060,337 | 4,207,133 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | **1,893,534,194** | **2,075,451,987** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,480,669,902 | 1,373,701,510 |
| සහනාධාරසහ මාරුකිරීම් | 17,501,644 | 19,454,168 |
| වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 6,812,330 | 227,259,790 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 77,271,596 | 11,560,292 |
| අත්තිකාරම් ගෙවීම් | 62,328,342 | 243,877,129 |
| තැන්පතු ගෙවීම් | 48,623,824 | 4,302,900 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | **1,693,207,638** | **1,880,155,789** |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | **200,326,556** | **195,296,198** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | **-** | **-** |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 200,326,556 | 195,296,198 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **200,326,556** | **195,296,198** |

| | | |
|---|---|---|
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | **(200,326,556)** | **(195,296,198)** |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ) | **-** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | **-** | **-** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **-** | **-** |
| | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | **-** | **-** |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) | **-** | **-** |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | **-** | **-** |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | **-** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් - අදාල නොවේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය - අදාල නොවේ.

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 41,044,000 | 50,798,620 | 40,551,704 | 79.83 |
| ප්‍රාග්ධන | 2,983,000 | 3,043,889 | 2,005,694 | 65.89 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි 171-1-2-0-1001 | 63 | 63 | 63 | 100 |
| 02 | දුම්රිය දෙපාර්තමේන්තුව | වොරන්ට් බලපත්‍ර 171-1-2-0-1003 | 5,203 | 5,203 | 5,203 | 100 |
| 03 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | පුද්ගල පඩිනඩි 171-1-2-0-1003 | 21 | 21 | 21 | 100 |
| 04 | රජයේ මුද්‍රණාලය | මුද්‍රණ කටයුතු 171-1-2-0-1201 | 143 | 143 | 143 | 100 |
| 05 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් - පුද්ගල පඩි නඩි- 171-1-2-1-1503 | 109,000 | 109,000 | 100,910 | 92.58 |
| 06 | සමාජ ආරක්ෂණ මණ්ඩලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් පුද්ගල පඩි නඩි- 171-1-2-2-1503 | 120,000 | 120,000 | 118,000 | 98.33 |
| 07 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් - අනෙ. පුනරාවර්තන - 171-1-2-1-1509 | 25,000 | 25,000 | 14,770 | 59.08 |
| 08 | සමාජ ආරක්ෂණ මණ්ඩලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් - අනෙ. පුනරාවර්තන 171-1-2-2-1509 | 30,000 | 30,000 | 27,800 | 92.66 |
| 09 | වැඩිහිටි මහලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් පුද්ගල පඩි නඩි- 171-1-2-4-1503 | 103,000 | 90,300 | 85,200 | 94.35 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 10 | ජාතික ළමාරක්ෂක අධිකාරිය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් පුද්ගල පඩි නඩි- 171-1-2-5-1503 | 260,000 | 260,000 | 250,850 | 96.48 |
| 11 | වැඩිහිටි මහලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් අනෙ. පුනරාවර්තන - 171-1-2-4-1509-006 | 20,000 | 36,900 | 35,350 | 95.79 |
| 12 | වැඩිහිටි මහලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් අනෙ. පුනරාවර්තන - 171-1-2-4-1509-007 | 25,000 | 20,800 | 17,420 | 83.75 |
| 13 | ජාතික ළමාරක්ෂක අධිකාරිය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම් අනෙ. පුනරාවර්තන - 171-1-2-5-1509 | 35,000 | 35,000 | 28,540 | 81.54 |
| 14 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- මූලධන 171-1-2-1-2201 | 5,300 | 5,300 | 5,300 | 100 |
| 15 | සමාජ ආරක්ෂණ මණ්ඩලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- මූලධන 171-1-2-2-2201 | 5,300 | 5,300 | 5,300 | 100 |
| 16 | වැඩිහිටි මහලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්- මූලධන171-1-2-4-2201 | 5,000 | 5,000 | 2,900 | 58 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 17 | ජාතික ළමාරක්ෂක අධිකාරිය | රාජ්‍ය ආයතන සඳහා මාරු කිරීම්-මූලධන 171-1-2-5-2201 | 40,000 | 40,000 | 35,145 | 87.86 |
| 18 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා වැටුප් ගෙවීම 171-2-7-0-1001 | 190,078 | 190,078 | 183,322 | 96.45 |
| 19 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ජීවන වියදම් දීමනාව 171-2-7-0-1003 | 81,369 | 81,369 | 79,235 | 97.37 |
| 20 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ගමන් වියදම් 171-2-7-0-1101 | 4,524 | 4,524 | 3,967 | 87.69 |
| 21 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා ලිපි ද්‍රව්‍ය දීමනා 171-2-7-0-1201 | 452 | 452 | 434 | 96.01 |
| 22 | ඇඹිලිපිටිය, ගම්පහ සිත්සරණ මධ්‍යස්ථාන | විදුලිය හා ජලය 171-2-7-0-1403 | 31 | 31 | 30 | 96.77 |
| 23 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | අඩු අදායම් ලාභී ආබාධිත පුද්ගලයන් සඳහා රු.5000/- දීමනාව 171-2-7-1-1501 | 8,000,000 | 7,761,355 | 5,609,276 | 72.27 |
| 24 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | වකුගඩු රෝගීන් සඳහා මූල්‍යාධාර ලබාදීම 171-2-7-4-1501 | 2,800,000 | 3,038,645 | 2,901,389 | 95.48 |
| 25 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා | 70 ට වැඩි වැඩිහිටි දීමනාව 171-2-7-11-1501 | 14,500,000 | 24,251,210 | 22,401,955 | 92.37 |
| 26 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා | 100 ට වැඩි වැඩිහිටි දීමනාව 171-2-7-12-1501 | 30,000 | 35,680 | 28,016 | 78.52 |

| අනුඅංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 27 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන නිලධාරීන් සඳහා දේපල ණය පොළී සඳහා රජයේ දායකත්වය 171-2-7-0-1506 | 1,323 | 1,325 | 1,155 | 87.17 |
| 28 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | උපදේශන වැඩසටහන් 171-2-7-8-2509 | 520 | 520 | 517 | 99.42 |
| 29 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා | අඩු අදායම්ලාභී ගෘහ ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම 171-2-7-013-2202 | 62,500 | 62,300 | 57,475 | 92.26 |
| 30 | දිවයිනේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 සඳහා | සෞභාග්‍ය වැඩසටහන 171-2-7-10-2202 | 147,772 | 147,772 | 102,368 | 69.27 |
| 31 | දි. ලේ. කා. දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ගමන් වියදම් | 20,000 | 20,000 | 15,986 | 79.9 |
| 32 | දි.ලේ. කා. දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 6,000 | 6,000 | 2,693 | 44.8 |
| 33 | දි.ලේ. කා. වවුනියාව | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 200 | 200 | 21 | 10.5 |
| 34 | දි.ලේ. කා. කිලිනොච්චි | විවිධ වියදම් | 600 | 600 | 159 | 26.5 |
| 35 | දි.ලේ. කා. කළුතර | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 200 | 200 | 40.5 | 20.25 |
| 36 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,දි. ලේ. දිවයින පුරා | කාන්තා අයිතීන් සම්බන්ධිකරණය සහ සුරක්ෂිත කිරීම | 7,000 | 7,000 | 3,962 | 56.6 |
| 37 | දි.ලේ. කා. දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරී වැඩසටහන්/කමිටු වියදම් | 15,000 | 15,000 | 11,500 | 76.6 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 38 | දි.ලේ. කා. දිවයින පුරා | කාන්තා දිරිගැන්වීම ව්‍යාපෘති | 30,000 | 30,000 | 20,581 | 68.6 |
| 39 | දි.ලේ. කා. දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ගමන් වියදම් | 15,000 | 15,000 | 7,894 | 52.6 |
| 40 | දි.ලේ. කා. දිවයින පුරා | ක්ෂේත්‍ර නිලධාරින්ගේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,500 | 3,500 | 1,222 | 34.9 |
| 41 | පරිවාස දෙපාර්තමේන්තුව | ළමා මූලික ආපදා අවමකරණ වැඩසටහන | 200 | 200 | 9 | 4.5 |
| 42 | දි.ලේ. කා. දිවයින පුරා | පෝෂණ දීමනා - ගැබිනි | 11,000,000 | 11,000,000 | 5,999,333 | 54.54 |
| 43 | දි.ලේ. කා. දිවයින පුරා | ළමුන් සම්බන්ධ වැඩසටහන් | 0.00 | 43,821 | 9,800 | 22.36 |
| 44 | දි.ලේ. කා. දිවයින පුරා | උදෑසන ආහාරවේල - පෙරපාසැල් | 1,450,000 | 1,450,000 | 707,619 | 48.8 |

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේතය | 31.12.2021දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 160,313 | 160,313 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 812,297 | 812,297 | - | - |
| 9153 | ඉඩම් | 112,300 | 112,300 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 825,646 | 825,646 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/B/MWCA/02/2023/16 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 30 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

**ශීර්ෂය 171 -කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 171 - කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා

දූෂ්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

(අ) අමාත්‍යාංශය විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත රු. 35,145,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් ලබා දී තිබුණත් එයින් රු.34, 447,244 ක් අධිකාරිය විසින් පුනරාවර්තන ස්වභාවයේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි.ඒ අනුව අධිකාරිය විසින් පුනරාවර්තන කාර්යයන් සඳහා යොදාගෙන තිබුණු මෙම මුදල අමාත්‍යාංශයේ ගිණුම් වල මූලධන වියදම් ලෙස පෙන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අවශ්‍යතාවයකින් තොරව අමාත්‍යාංශය විසින් වැය විෂයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් එකතුව රු. 49,501,000 ප්‍රතිපාදන සලසාගෙන තිබීම හේතුවෙන් රු. 30,767,473 වූ එනම් සියයට 58 ත්, සියයට 100 ත් අතර ප්‍රතිපාදන අදාළ කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව ඉතිරි වී තිබුණි. එහි එක් වැය විෂයක් සඳහා වෙන්කරවාගෙන තිබූ මුළු ප්‍රතිපාදනයම වියදම් කිරීමකින් තොරව මුළුමනින්ම ඉතිරි කරගෙන තිබූ අතර තවත් වැය විෂයක් සඳහා වෙන්කරවාගෙන තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 58 ක ප්‍රතිපාදනයක් ඉතිරි කරගෙන තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 5 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු.23,915,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 2 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයයන් වෙත මුළු ප්‍රතිපාදනයම හෝ ප්‍රතිපාදනයෙන් සියයට 50 – 100 දක්වා පරාසයකින් ප්‍රතිපාදන අඩුකර ගැනීමෙන් හා වැය විෂයයන් 5 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ ප්‍රතිපාදන සියයට 50-114 දක්වා පරාසයකින් වැඩි කර ගැනීමක් කර තිබුණි.

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය 17(2) ව්‍යවස්ථාව | කමිටු සාමාජිකයින් 15 දෙනෙකුගෙන් යුත් ජාතික කාන්තා කමිටුව මාස දෙකකට වරක් හෝ අවශ්‍යතා අනුව, හැකිතාක් නිරතුරුව කමිටුව රැස්විය යුතු වුවත් වසර 1 ½ කින් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණු අතර , අනුකමිටු රැස්වීම්ද පවත්වා නොතිබුණි. |

## 2.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ප්‍රතිපාදන නොමැති අවස්ථා වලදී බැරකම් වලට එළඹීම නොකරන ලෙස දැනුම් දී තිබියදී රු.1,387,265 ක බැරකම් වලට එළඹ ඇති බව අමාත්‍යාංශ බැරකම් ලේඛණය අනුව තහවුරු විය.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) ගෘහස්ථ හිංසනයට හා මිනිස් ජාවාරමට ලක් වූ කාන්තාවන් ආරක්ෂා කර ගැනීම යටතේ කාන්තා රැකවරන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය වෙනුවෙන් 2023 වර්ෂය සඳහා රු.මිලියන 12 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, විගණිත දින වූ 2023 දෙසැම්බර් 31 දින දක්වාම කාන්තා රැඳවුම් මධ්‍යස්ථාන පවත්වාගෙනයාම පිළිබඳ මාර්ගෝපදේශයක් සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් රු. මි. 1.2 ක් වැයකර රාජකාරී දිනපොත් මුද්‍රණය කර කාන්තා කාර්යාංශයට අයත් ප්‍රාදේශීය කාර්යාලවල සිටින නිලධාරීන් වෙත ලබාදී තිබුණද මෙම දින පොත් විධිමත් ලෙස භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. ඒ අනුව එම රාජකාරී දින පොත් ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) 2023 සැප්තැම්බර් වනවිටත් වසාදමා තිබුණ කළුතර උපදේශන මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම සඳහා මාසිකව රු. 20,000 බැගින් වාර්ෂිකව 240,000 ක් ගෙවීම් සිදු කර තිබූ අතර වාර්ෂිකව ඒ සඳහා ගෙවන රු. 240,000 නිෂ්කාර්ය බව නිරීක්ෂණය විය.

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ශ්‍රී ලංකාවේ ළමා දිවාසුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම, ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම අමාත්‍යාංශයෙහි ප්‍රධාන කාර්යයක් වන අතර ශ්‍රී ලංකාවේ ළමා දිවාසුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තියේ මූලික කෙටුම්පත 2018වසරේදී සකස් කර ඇතත් එහි පැවති අඩුපාඩු හේතුවෙන් නැවත සකස් කිරීම සඳහා ජාතික ළමාරක්ෂක අධිකාරියට පවරා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයටත් ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කර නොතිබුණි.

(ආ) 2022දෙසැම්බර් 31දින වන විට ආරම්භ කරනු ලැබූ වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා 59න් සුළු මූල්‍ය ශාඛා 29ක් අක්‍රියව පවතින අතර මෙම අක්‍රිය ශාඛා ගිණුම් වල එකතුව රු.49,771,128 ක ශේෂයක් ඇවර කිරීමකින් හෝ ගණුදෙණු කිරීමකින් තොරව තැන්පතු ලෙස පවතින බව බවද, ශාඛා 07ක ගිණුම් ශේෂ පිළිබඳ තොරතුරු කාර්යාංශය සතුව නොමැති බවද නිරීක්ෂණය විය.එසේම අක්‍රිය ශාඛා 29සඳහා ආරම්භක ප්‍රාග්ධනය ලෙස කාර්යාංශය විසින් රු.1,100,000 ක මුදලක් ලබා දී ඇති බවද නිරීක්ෂණය වූ අතර මෙම මුදල කිසිදු ණය දීමේ කටයුත්තකට භාවිතා නොකර වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා ගිණුම් වල තැන්පත් කර ඇති බව සඳහන් කලද ,ශාඛා තැන්පතු ශේෂ පිළිබඳ ස්ථාවර තැන්පතු සහතික හෝ පාස් පොත් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) අමාත්‍යාංශය විසින් වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා ආරම්භ කිරීමට ස්ථාවර වත්කම් වලට අමතරව ප්‍රාග්ධනය ලෙස මුදලින් රු.1,600,000 ක් සහ ඒවායේ පුහුණු හා පරිපාලන කටයුතු සඳහා රු.2,101,156 ට අධික මුදලක් වියදම් කර තිබුණද ,වර්තමානය වන විට එම වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා වල පරිපාලනය ,ගිණුම් තැබීම ,විගණන කටයුතු හා ණය දීමේ සහ ණය අයකර ගැනීමේ කටයුතු සක්‍රියව සිදු නොවන බවද ගණුදෙණු කිරීමකින් තොරව ගිණුම් වල මුදල් තැන්පත් කර ඇති බවත් විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්වය නගාසිටුවීම හා ආර්ථික සවිබල ගැන්වීමේ අරමුණ ඇතිව ඔවුන්ගේ නිෂ්පාදන මාර්ගගත වේදිකාවක් හරහා ප්‍රවර්ධනය කිරීම සඳහා ඩිජිටල් අලෙවිකරණ වේදිකාවක් නිර්මාණය කිරීම යන තේමාව යටතේ රු.4,458,063 ක පිරිවැයක් දරා Lanka Women E-market වෙබ් අඩවිය 2020 වර්ෂයේ නිර්මාණය කර, 2022 මාර්තු 08 දින එළි දක්වා තිබුණි.මෙම වෙබ් අඩවිය එළි දක්වා වසර 2 ක කාලයක් ගත තිබුණද, කිසිදු නිෂ්පාදන

අලෙවියක් සිදු වී නොතිබුණු අතර සැපයුම්කරුවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ලියාපදිංචි වීම පමණක් සිදුවී තිබුණි.තවද, මෙම වෙබ් අඩවිය නිර්මාණයේදී එකගවී ඇති අනුමත පිරිවිතර වලට අනුකූලව වෙබ් අඩවිය නිර්මාණය වී නොමැති බවද, ඒ අනුව E-market පද්ධතිය පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික සහාය නොලැබීම, ව්‍යවසායක කාන්තාවන්ගේ තාක්ෂණික සාක්ෂරතාවය අවම වීම, නිශ්පාදිත වල පැහැදිලි ඡායාරූප ගැනීමේ හැකියාවක් නොමැති වීම හා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රමාණවත් වගකීමක් අමාත්‍යාංශයේ අදාල අංශ වලින් නොදැරීම යන ආදිය ඩිජිටල් අලෙවිකරණ වේදිකාව අසාර්ථක වීමට හේතු වී තිබුණි.

(ඉ) අමාත්‍යාංශය යටතේ පවතින අංශයක් වූ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය තුල සංවර්ධන නිලධාරීන් 3 දෙනෙකු සිටියද, තත්‍ය කාර්ය මණ්ඩලයේ සංවර්ධන නිලධාරීන් 16 දෙනෙකු අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා තිබූ අතර වැටුප් හා වේතන වශයෙන් රු. 8,000,000 ක මුදලක් වාර්ෂිකව ගෙවා තිබුණි.

(ඊ) දිළිඳුකම පිටු දැකීම සඳහා ජනාධිපති කාර්යාලය යටතේ ග්‍රාම ශක්ති කාර්යාංශයක් ස්ථාපනය කිරීම හා "ග්‍රාම ශක්ති' වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන අංක අමප/17/0529/701/004 දරණ 2017 මාර්තු 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ක්‍රියාත්මක කර තිබූ වැඩසටහනේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පවතින දරිද්‍රතාවය 2030 වන විට තුරන් කිරීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 25 ක් සඳහා අදියර I හා II වශයෙන් සමිති 3618ක් ස්ථාපිත කර තිබුණි. එයින් සමිති 2067 ක් එනම් 57%ක් පමණ අක්‍රිය මට්ටමේ පැවති අතර ග්‍රාම ශක්ති සමිති හා ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම් වල රු.635,705,116 ක මුදලක් නිශ්කාර්යව පැවතුනි.

## 3.2. විදේශ ආධාර ව්‍යාපෘති

සාර්ක් සාමාජික රටවල කාන්තාවන් සහ ළමුන් සඳහා ගාස්තු රහිත දුරකථන උපකාරක සේවා ව්‍යාපෘතිය කාන්තාවන්ගේ හා ළමුන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කිරීම අරමුණු කරගෙන කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය 2017 නොවැම්බර් 06 දිනැති සාර්ක් සංවර්ධන අරමුදලේ ප්‍රදාන ගිවිසුම මගින් කාන්තාවන් හා ළමුන් සඳහා ගාස්තු රහිත දුරකථන උපකාරක සේවා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි.මෙම ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් 30 දිනට අවසන් කල යුතුව ඇතත් 2024 අප්‍රේල් 03 දින දක්වා ව්‍යාපෘති අවසන් කිරීමේ කාලය දීර්ඝ කර තිබූ අතර 2023 වර්ෂය අවසානයටත් සියයට 30 ක අවම ප්‍රගතියක් ලබාගෙන තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ KE-7854 සහ KH-9237 වාහන දෙක 2022 වර්ෂයේ සිට හා KH-1737 වාහනය 2021 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර එම වාහන අළුත්වැඩියා කර ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 පාඩු හා හානි**

වසර 5 ට වඩා වැඩි රු. 5,774,908 ක් වටිනා අලාභ හානි සිදුවීම් අවස්ථා 2ට අදාළ අගය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**3.5 කළමනාකරණ දුර්වලතා**

මියගිය නිලධාරීන් තිදෙනෙකුට අදාළව අයවිය යුතු වසරකට වඩා වැඩි කාලයක් පවතින එකතුව රුපියල් 455,330 ක් වූ ණය ශේෂ 3 ක්, 2022 හා 2023 වර්ෂවල විශ්‍රාම ගිය නිලධාරීන් හත්දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රුපියල් 1,731,541 ක් වූ ණය ශේෂ හා 2023 වර්ෂයේ සේවය හැර ගිය නිලධාරීන් පස්දෙනෙකුගෙන් අයවිය යුතු රුපියල් 611,006 ක එකතු වටිනාකම රු . 2,797,877ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

# පරිච්ඡේදය 04

## කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශන | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 % - 90 % | 75 % - 89 % | 50 % - 74 % |
| **කාන්තා හා ළමා කටයුතු අංශය** | | | |
| දිස්ත්‍රික්ක 25 සඳහා දිස්ත්‍රික් කාන්තා හා ළමා සංවර්ධන කමිටු රැස්වීම් පැවැත්වීම (25*4)- කමිටු රැස්වීම් සංඛ්‍යාව | | | √ |
| ලිංගික හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන දෙවන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම (2024-2028)- ක්‍රියාකාරී සැලැස්ම | √ | | |
| ගර්භනී හා කිරිදෙන මව්වරුන්ට රු. 45,000/-ක පෝෂණ දීමනාවක් ලබාදීමේ වැඩසටහන - ගර්භනී මව්වරු සංඛ්‍යාව | √ | | |
| පෙර පාසල් දරුවන්/ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා උදෑසන ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන - ප්‍රතිලාභ ලබාදුන් පෙරපාසල් දරුවන් සංඛ්‍යාව | | | √ |
| පෙර පාසල් ගුරුවරියන් සඳහා රුපියල් 2500/-ක මාසික දීමනාවක් ලබාදීමේ "ගුරු අභිමානී" වැඩසටහන - දීමනාව ලබාදුන් පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව | | √ | |
| දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ආර්ථික අපහසුතා සහිත දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම - ආධාර ලබාදුන් දරුවන් සංඛ්‍යාව | √ | | |
| අවදානම් සහගත දරුවන් වෙනුවෙන් ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම - ක්‍රියාත්මක කරන ලද ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව | √ | | |
| ළමා සමාජ හා ළමා සභා වැඩසටහන - පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව | | √ | |
| ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම - දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| ළමුන්ට එරෙහි හිංසනය වැළැක්වීමේ හා ප්‍රතිචාර දැක්වීමේ ප්‍රජාපාදක වැඩසටහන් පැවැත්වීම - පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | √ | | |

| විශේෂිත දර්ශන | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100 % - 90 % | 75 % - 89 % | 50 % - 74 % |
| පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරකුම් පව්ව) - පිහිටුවන ලද කමිටු සංඛ්‍යාව | √ | | |
| පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කෙරෙන "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන"- ලියාපදිංචි කරන ලද පාසල් සංඛ්‍යාව | √ | | |
| 1929 ළමා උපකාරක දුරකතන සේවය - පැමිණිලි සංඛ්‍යාව | √ | | |
| විවිධ ඉලක්කගත කාන්තාවන් (අඩු ආදායම්ලාභී, ධීවර, වතු, ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමවලින් පීඩාවට පත්) ආර්ථික වශයෙන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ස්වයං රැකියා ව්‍යාපෘති ආධාර ලබාදීම - කාන්තාවන් සංඛ්‍යාව | √ | | |
| දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩිදියුණු කිරීම සඳහා දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩල නියෝජිතයින් දැනුවත් කිරීම - පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | | √ | |
| කුඩා හා මධ්‍ය පරිමාණ ණය/සහණාධාර මත තිරසාර ව්‍යවසායන්හි යෙදී සිටින කාන්තාවන් සංඛ්‍යාව | | √ | |
| ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය වැඩිවූ ප්‍රතිශතය | | √ | |
| රැකියා උදෙසා විදේශගත වූ සහ විදේශගතවීමට ඉඩකඩ ඇති කාන්තාවන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති සංඛ්‍යාව | √ | | |
| තාවකාලික රැකවරණ මධ්‍යස්ථාන වෙතින් සේවා සපයන ලද සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| උපදේශන මධ්‍යස්ථාන සඳහා යොමුවන ලද සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ සේවාලාභීන් සංඛ්‍යාව | √ | | |
| ව්‍යවසායකයින් ලෙස සවිබලගැන්වූ වැන්දඹු ගෘහ මූලික කාන්තාවන් සංඛ්‍යාව | √ | | |
| **සමාජ සවිබලගැන්වීම් අංශය** | | | |
| ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් වැළැක්වීම සඳහා සිදු කරන ලද මැදිහත්වීම් ගණන (PWDs) | √ | | |
| සමාජ ගැටළු අවම කිරීම සඳහා පවත්වනු ලබන පර්යේෂණ, පුහුණු, උපදේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | √ | | |
| වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කරන ලද මැදිහත්වීම් ගණන | √ | | |
| විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා බඳවාගත් සාමාජිකයින් සංඛ්‍යාව | | √ | |
| සෞභාග්‍යා නිෂ්පාදන ගම්මානය ලෙස සංවර්ධනය වූ ගම්මාන සංඛ්‍යාව. | √ | | |

# පරිච්ඡේදය 05

## තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0 % - 49 % | 50 % - 74 % | 75 % - 100 % |
| **කාන්තා හා ළමා කටයුතු අංශය** | | | | | |
| 1) සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම (SDG 01) | 1.1) ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවන්ගෙන් පෙළෙන සියලු වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම (1.2) | 1.1.1) ස්වයං රැකියා/ ජීවනෝපාය ආධාර ලබාදුන් කාන්තාවන් ගණන | | | √ |
| | 1.2) දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම (1 b) | 1.2.1) ආදායම් උත්පාදන පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | | | √ |
| | | 1.2.2) වැන්දඹු/ගෘහමූලික කාන්තාවන් ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාදුන් කාන්තාවන් ගණන | | | √ |
| | | 1.2.3) අවදානම් සහගත දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් (care plans ) වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ආධාර ලබාදුන් ළමුන් ගණන. | | | √ |
| | | 1.2.4) ආපදා අවස්ථාවන්හිදී කාන්තාවන්ට සිදුවන බලපෑම අවම කිරීම පිණිස ආපදාවන් නිසා හානියට පත් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යළි නඟා සිටුවීමට ආධාර ලබාදීම. | | | √ |
| | | 1.2.5) ගෘහ සේවය සඳහා විදේශ ගතවන කාන්තාවන්ගේ ආර්ථිකය, පවුල් සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විකල්ප ආදායම් උත්පාදන වැඩසටහන් ව්‍යාපෘති සංඛ්‍යාව | | | √ |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0 % - 49 % | 50 % - 74 % | 75 % - 100 % |
| | | 1.2.6) විශේෂිත හේතූන් මත සමාජ සංවේදීතාවය අහිමි වූ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වූ ව්‍යාපෘති සංඛ්‍යාව | | | √ |
| 2) සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතභාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (SDG 02) | 2.1) අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි බව සහ ක්ෂය විම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වනවිට ළඟාකර ගැනීමද ඇතුළත්ව 2030 වනවිට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්ත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගර්භණී මව්වරුන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබාදීම. (2.2) | 2.1.1) " පෝෂණ දීමනාව" වැඩසටහන යටතේ රු.4500ක මාසික දීමනාව ලබාගත් ගර්භනී හා කිරිදෙන මව්වරුන් ගණන | | | √ |
| | | 2.1.2) "උදෑසන ආහාරවේල" වැඩසටහන යටතේ උදෑසන පෝෂණීය ආහාර වේලක් ලබා දුන් පෙර පාසල් දරුවන් ගණන | | √ | |
| | | 2.1.3) වෛද්‍ය හා පෝෂණ ආධාර ලැබූ ළමයි සංඛ්‍යාව | | | √ |
| 3) පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම (SDG 04) | 3.1) 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශවීමේ අවස්ථාව පැවතීම හා එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම (4.2) | 3.1.1) “ගුරු අභිමානී” වැඩසටහන යටතේ රු.2500 ක මාසික දීමනාවක් ලබාදුන් පෙර පාසල් ගුරුවරු සංඛ්‍යාව | | | √ |
| | 3.2) ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, | 3.2.1) අලුතින් ඉදි කරන ලද හා අළුත්වැඩියා කරන ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගණන (වතුකරයද ඇතුළත්ව) | | | √ |
| | | 3.2.2) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආධාර ලබාදුන් මුල් ළමාවිය | | | √ |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
